07 ශ්‍රේණිය – විද්‍යාව

ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු 01 වාරය 2022

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

(විවිධ පළාත්, කලාප සහ පාසල් මගින් පළමුවන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 07ක් සහ ලැබී ඇති පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

ආනන්ද විද්‍යාලය Ananda College

ආනන්ද විද්‍යාලය - කොළඹ

පළමුවෙනි වාර ඇගයීම 2016 - 7 ශ්‍රේණිය

විද්‍යාව | **කාලය – පැය 1 ½ යි**

අංකය ....   පන්තිය ....

<u>I කොටස</u>

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) මේ අතරින් අපුෂ්ප ශාකයක් වන්නේ කුමක්ද?

1. ඉද්ද   2. යුකැලිප්ටස්   3. සයිප්‍රස්   4. කරපිංචා

(2) මුදුන් මූල පද්ධතියක් දැකගත නොහැකි ශාකය වන්නේ

1. කුප්පමේනියා   2. හෙන්දිරික්කා
3. ලීක්ස්   4. රෝස

(3) ශාක මුල් සතු ප්‍රධානතම කාර්යයක් නොවන්නේ

1. ශාකය පසට සවි කිරීම   2. ආහාර සංචිත කිරීම
3. ඛනිජ ලවණ උරා ගැනීම   4. ජලය උරා ගැනීම

(4) මේ අතරින් වායව මුල් දැකිය හැකි ශාකය වන්නේ

1. වැටකෙයියා   2. නිදිකුම්බා
3. රම්පේ   4. උඩවැඩියා

(5) ආධාරක ශාකයට හෝ උපස්තරයට තදින් සවි වීමට ශාකයකට උදව් වන මුල් වර්ගය වන්නේ

1. වායුධර මුල්   2. ආලග්න මුල්
3. කයිරු මුල්   4. කරු මුල්

(6) ශාක පත්‍රයක A,B,C කොටස නිවැරදිව දක්වා ඇත්තේ

1. පත්‍ර අග්‍රය / පත්‍ර තලය / පත්‍ර වෘන්තය
2. පත්‍ර පාදය / පත්‍ර අග්‍රය / පත්‍ර තලය
3. පත්‍ර තලය / පත්‍ර පාදය / පත්‍ර අග්‍රය
4. පත්‍ර පාදය / පත්‍ර අග්‍රය / පත්‍ර ධාරය



(7) පරාගනයෙන් පසු ඵලයක් බවට පත් වන්නේ පුෂ්පය සතු

1. ඩිම්බයි   2. ඩිම්බකෝෂයයි   3. කීලයයි   4. කලංකයි

(8) මේ අතරින් සරල පත්‍ර සහිත ශාකයක් නොවන්නේ

1. කරපිංචා   2. මඤ්ඤොක්කා   3. ගස්ලබු   4. කොස්

(9) පිරිමැදීමේ දී සෘණ ආරෝපිත තත්ත්වයට පත්වන ද්‍රව්‍ය යුගලය වන්නේ?

1. එබනයිට් / සේද
2. එබනයිට් / ලෝම
3. ලෝම / වීදුරු
4. එබනයිට් / වීදුරු

(10) ධාරිත්‍රකයක ගබඩා කල හැකි ආරෝපණ ප්‍රමාණය මනින්නේ

1. ඇම්පියර් වලිනි
2. ෆැරඩ් වලිනි
3. මිලි ඇම්පියර් වලිනි
4. වෝල්ට් වලිනි

(11) සරල කෝෂයෙහි + අග්‍රය වන්නේ

1. තුත්තනාගම් (සින්ක්) තහඩුවයි
2. කාබන් කූරයි
3. තඹ තහඩුවයි
4. සිලිකන් තහඩුවයි

(12) පිරිමැදීමේදී යම් ද්‍රව්‍යයක් ස්ථිතී විද්‍යුත් + තත්ත්වයට ආරෝපණය වූයේ නම්

1. පිරිමැදීමේදී එම ද්‍රව්‍යයට අනිත් ද්‍රව්‍ය යෙන් + අංශු පැමිණ ඇත
2. පිරිමැදීමේදී එම ද්‍රව්‍ය යෙන් අනිත් ද්‍රව්‍යයට - අංශු ඉවත් වී ගොස් ඇත
3. පිරිමැදීමේදී එම ද්‍රව්‍ය යෙන් අනිත් ද්‍රව්‍යයට + අංශු ඉවත් වී ගොස් ඇත
4. පිරිමැදීමේදී ද්‍රව්‍ය 2 අතරට + හා - අංශු එකිනෙක හුවමාරු වී ඇත

(13) ස්ථිතී විද්‍යුත් ආරෝපණ හඳුනා ගැනීමට භාවිතා වන්නේ

1. ගැල්වනෝමීටරයයි
2. ස්වර්ණ පත්‍ර විද්‍යුත් දර්ශකයයි
3. ස්වර්ණ පත්‍ර ඇමීටරයයි
4. ධාරිත්‍රකයයි

(14) ජලයෙන් පිටතට ගත් මත්සයකු මිය යන්නේ

1. ජලය නොමැති නිසාය
2. ඔක්සිජන් නොලැබීම නිසාය
3. උණුසුම නිසාය
4. විලෝපිකයන්ට ගොදුරු වීම නිසාය

(15) විනාකිරි අයත් වන්නේ කවර කාණ්ඩයටද

1. රසකාරක
2. භාෂ්මික
3. ආම්ලික
4. ලවණ

(16) සබන් / ෂැම්පු / අළු අයත් වන්නේ කවර කාණ්ඩයටද

1. ආම්ලික
2. භාෂ්මික
3. උදාසීන
4. ලවණ

(17) පිනොප්තලීන් දර්ශකය දෙහි යුෂ සමග මිශ්‍ර කල විට වර්ණය වන්නේ

1. රෝස
2. කහ
3. අවර්ණ
4. තැඹිලි

(18) රතු ලිට්මස් වල වර්ණය නිල් පැහැයටහැරවිය හැක්කේ පහත සඳහන් කවර ද්‍රව්‍යයටද?

1. සියඹලා
2. ලුණු දියර
3. සබන්
4. ඇසිටික් අම්ලය

(19) අම්ල පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.

1. දෙහි / සබන් / ලුණු
2. හුනු / ලුණු / විනාකිරි
3. විනාකිරි / දෙහි / සියඹලා
4. ලුණු / විනාකිරි / දෙහි

(20) නිවැරදි පිළිතුර තෝරන්න.

1. සොබාදහමෙහි අපූර්වත්වය චමත්කාරජනක බව කියා නිම කල නොහැක
2. මිනිසා විසින් සොබාදහමට ඉමහත් මෙහෙයක් ඉටු කරයි
3. බඩ ඉරිඟු බීජය තුල බීජ පත්‍ර දෙකක් දැකිය හැක
4. පිරිමැදීමේදී ද්‍රව්‍ය මතුපිට විද්‍යුත් ආරෝපණ හටගන්නා බව බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් විසින් සොයා ගන්නා ලදී

II කොටස

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ස්වාභාවික පරිසරයට නැතිවම බැරි ජීවී කාණ්ඩයකි ශාක.

a) ශාකයක මූල පද්ධතිය විසින් ඉටු කරන ප්‍රධානතම කාර්යයන් 2 මොනවාද?

1. ....
2. ....

b) කුප්පමේනියා ශාකයේත් බඩ ඉරිඟු ශාකයේත් මූල පද්ධති අතර දැකිය හැකි වෙනස්කම කුමක්ද?

....

(ලකුණු 1)

c) ගැලපෙන පිළිතුර යා කරන්න.

• වායුධර මුල් සහිත ශාකයකි	• ගම්මිරිස්
• ආලග්න මුල් සහිත ශාකයකි	• උඩවැඩියා
• වායව මුල් සහිත ශාකයකි	• කිරල
• කරු මුල් සහිත ශාකයකි	• වැටකෙයියා

(ලකුණු 1)

d) ✓ හෝ × සලකුණ යොදන්න.

1. හොර එලයේ මනිපත්‍ර විශාල සහ තටු 2ක් බවට පත් වී ඇත. ( )
2. මුල් වල ආහාර ගබඩා කිරීමට උදාහරණයකි අර්තාපල් ( )
3. වැටකෙයියා ශාකයට නොවැටී සිටීමට කරු මුල් ආධාර වේ ( )
4. පුවක් ශාකයට ඇත්තේ සංයුක්ත පත්‍ර වේ ( )
5. බුලත් කොලයක ජාලාබ නාරටි වින්‍යාසයක් දැකගත හැක ( )
6. ——| |—— රූපයෙන් දැක්වෙන්නේ LED බල්බයක සම්මත සංකේතයයි ( )

(ලකුණු 3)

e) පහත සඳහන් අවස්ථා සඳහා උදාහරණ 2 බැගින් සඳහන් කරන්න.

1. කොල පැහැති වී ආහාර නිපදවීමට දායක වන කඳන් ඇති ශාක

....

2. භූගත කඳන් ඇති ශාක ....

3. කඳ තුල ආහාර ගබඩා කරන ශාක

....

(ලකුණු 3)

f) පුෂ්පයකින් ශාකයට ඇති ප්‍රයෝජන මොනවාද?

....

(ලකුණු 1)

g) පුෂ්පයක් සතු පහත සඳහන් කොටස් වලින් ඉටු කරන කාර්යය සඳහන් කරන්න.

1. වර්ණවත් පෙති ....

2. කලංකය ....

3. ඩිම්බ කෝෂය ....

4. පරාගධානිය .... (ලකුණු 2)

h) පුෂ්පයක ඇති පුමංගයට අයත් වන කොටස් නම් කරන්න.

....

(ලකුණු 1)

i) පුෂ්පයක ජායාංගි කොටස රූපයක ඇඳ කොටස් නම් කරන්න.

(ලකුණු 1)

(මුළු ලකුණු – 15)

(2) එදිනෙදා කටයුතු වලදී විදුලිය අපට බොහෝ සේ ප්‍රයෝජනවත් වේ.

1. විදුලිය උත්පාදනය කරනු ලබන උපාංග හඳුන්වන්නේ කෙසේද?

....

(ලකුණු 1)

2. එවැනි උපාංග 3ක් නම් කරන්න.

....

(ලකුණු 1 ½)

3. a) රාත්‍රී කාලයේදී පා පැදි කරුවෙකුට ආලෝකය හා ආරක්ෂාව ලබා ගැනීම සඳහා පාපැදියට සවිකර ඇත්තේ කුමක්ද?

....

(ලකුණු 1)

b) එමගින් විදුලිය ලැබෙන්නේ කෙසේද?

....

(ලකුණු 1)

4. දෙහි ගෙඩියකින් විදුලිය නිපදවීමට ඔබ විසින් සිදුකල ක්‍රියාකාරකම රූපසටහනකින් ඇඳ කොටස් නම් කරන්න.

(ලකුණු 1 ½)

5. කෝෂයකට වඩා බැටරියකින් ලැබෙන වාසිය කුමක්ද?

....

(ලකුණු 1 ½)

6. සරල කෝෂයක පවතින දුර්වලතා 2ක් සඳහන් කරන්න.

i. ....

ii. ....

(ලකුණු 2)

7. පහත සඳහන් උපාංග සඳහා භාවිත වන සම්මත සංකේත මොනවාද?

i. කෝෂය .... ii. ධාරිත්‍රකය ....

(ලකුණු 2)

8. විදුලි පරිපථයකට මැද බිංදු ඇමීටරයක් සම්බන්ධ කිරීමෙන් අපට ලබාගත හැකි තොරතුරු 2ක් සඳහන් කරන්න.

i. ....

ii. ....

(ලකුණු 1)

9. a) සරල ධාරාවක් යන්නෙහි අදහස කුමක්ද?

....

(ලකුණු 1)

b) සරල ධාරාවක් භාවිත වන උපාංග මොනවාද?

....

(ලකුණු 1)

c) සරල ධාරාව කාලයත් සමග ප්‍රස්තාරගත කල විට ලැබෙන ප්‍රස්තාරය ඇඳ දක්වන්න.

....

(ලකුණු 1)

(මුළු ලකුණු 15)

(3) ජලය අපහට නැතිවම බැරි සම්පතකි.

1. බොහෝ දේ ජලය තුළ දියවන්නේ ජලය සතු කවර ගුණාංගයක් නිසාද?

....

(ලකුණු 1)

2. ජලය තුළ අර්ධ ලෙස දියවන ද්‍රව්‍ය 3ක් නම් කරන්න.

....

(ලකුණු 1 ½)

3. ජලය තුළ හොඳින් දියවන ද්‍රව්‍ය 5ක් හා දිය නොවන ද්‍රව්‍ය 5ක් සඳහන් කරන්න.

හොඳින් දියවන දේ	දිය නොවන දේ
1.	1. ....
2.	2. ....
3.	3. ....
4.	4. ....
5.	5. ....

(ලකුණු 5)

4. ජලය තුළ ද්‍රව්‍ය දියවීමේ ගුණය එදිනෙදා කටයුතු වලදී ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 3ක් සඳහන් කරන්න.

i. ....

ii. ....

iii. ....

(ලකුණු 1 ½)

5. ජලය සතු සිසිලනකාරක ගුණය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

....

....

(ලකුණු 2)

6. ජලයේ ඇති සිසිලනකාරක ගුණය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 3ක් සඳහන් කරන්න.

i. ....

ii. ....

iii. ....

(ලකුණු 1 ½)

7. අපගේ ශරීර අභ්‍යන්තර ක්‍රියාවලි සඳහා ජලය වැදගත් වන ආකාර 3ක් සඳහන් කරන්න.

i. ....

ii. ....

iii. ....

(ලකුණු 1 ½)

8. මුහුදු ජලයෙන් ලුණු වෙන්කර ගැනීමට ඔබට සිදු වුවහොත් විද්‍යාගාරය තුලදී ඔබ විසින් ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

....

....

(ලකුණු 1)

(මුළු ලකුණු 15)

(4)

1. ද්‍රව්‍ය පිරිමැදීමේදී එම ද්‍රව්‍ය තුළ සිදුවන වෙනස කුමක්ද?

....

(ලකුණු 1)

2. පහත අවස්ථා දෙක සලකන්න.

1 අවස්ථාව

ඉහත 'A' දණ්ඩ 'B' දණ්ඩ වෙතට ලංකල විට 'B' දණ්ඩ තරමක් දුරස් විය 'B' හි ගබඩා වී ඇති ආරෝපන වර්ගය කුමක්ද?

....

(ලකුණු 1)

3. 2 අවස්ථාව



එම 'X' දණ්ඩ 'Y', දණ්ඩ වෙතට ලංකල විට 'Y' දණ්ඩ 'X' දෙසට ආකර්ශනය විය. 'Y' හි ගබඩා වී ඇති ආරෝපණ වර්ගය කුමක්ද?

....

(ලකුණු 1)

4. ඉහත එක් එක් අවස්ථා සම්බන්ධයෙන් ගත හැකි නිගමන වෙන වෙනම ලියන්න.

1 අවස්ථාව ....

2 අවස්ථාව .... (ලකුණු 2)

5. ස්ථිථි විද්‍යුත් ආරෝපණ ඉවත් වී යා හැකි ක්‍රම 2ක් ලියන්න.

....

....

(ලකුණු 2)

6. ස්ථිථි විද්‍යුත් ආරෝපණ ගබඩා කර තබා ගන්නා විද්‍යුත් උපාංගය කුමක්ද?

....

(ලකුණු 1)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

පළමුවාර පරීක්ෂණය - 2018 | 7 ශ්‍රේණිය

முதலாம் தவணைப் பரீட்சை - 2018 | தரம் 7

First Term Test - 2018 | **Grade 7**

විද්‍යාව
Science

කාලය : පැය 02
02 hours

I කොටස

සැලකිය යුතුයි. : සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- වඩාත් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1. සපුෂ්ප ශාකයක් හා අපුෂ්ප ශාකයක් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

   1. ජම්බු, මිරිස් 3. මඬු, සියඹලා
   2. කරවිල , පයිනස් 4. මඬු , පයිනස්

2. ජාලාභ නාරටි වින්‍යාසයක් ඇති පත්‍ර තිබෙන ශාකය වන්නේ

   1.දොඩම්ය. 2.පොල්ය. 3.වී ය. 4.ඉරිඟු ය.

3. නුග ශාකයේ අතු වලින් හටගෙන පොළවට වැඩෙන මුල් වර්ගය හැඳින්වෙන්නෙ

   1.ආලග්න මුල් වශයෙනි. 3.කරුමුල් වශයෙනි.
   2.කයිරු මුල් වශයෙනි. 4.වායව මුල් වශයෙනි.

4. සේද වලින් පිරිමදින ලද වීදුරු බටයක් ඇත.මෙහිදී සේද රෙදි කැබැල්ලට හා වීදුරු බටයට ලැබී ඇති ස්ථිති විද්‍යුත් ආරෝපණ පිළිවෙලින් ,

   1.ධන හා ධන වේ. 3.සෘණ හා ධන වේ.

   2.ධන හා සෘණ වේ. 4.සෘණ හා සෘණ වේ.

5. පුෂ්පයක කොටසක් මෙහි දැක්වේ. මෙහි A හා B වන්නේ පිළිවෙලින්



1.කලංකය සූත්‍රිකාව 3.කලංකය කීලය

2.පරාගධානිය කීලය 4.පරාගධානිය සූත්‍රිකාව

6. ධාරිත්‍රකයක ගබඩා කළ හැකි විද්‍යුත් ආරෝපණ ප්‍රමාණය මනිනු ලබන ඒකකය වන්නේ,

1.ඇම්පියර්ය. 2.ෆැරඩ්ය 3.නිව්ටන්ය 4.වෝල්ට්ය

7. විනාකිරි හා හුණුදියර පිළිවෙලින් කවර ද්‍රව්‍යය වර්ග වලට අයත්ද?.

1.අම්ල භෂ්ම 2.භෂ්ම අම්ල 3.අම්ල උදාසීන 4.අම්ල අම්ල

8. ජලයේ වඩා හොඳින් දියවන ද්‍රව්‍යයක් වනුයේ මින් කුමක්ද?.

1.තිරිඟු පිටි 2.කහ කුඩු 3.ලුණු කුඩු 4.නිල් කුඩු

9. සබන් ගා සෝදා හැරීමෙන් රෙදිවල ඇති කුණු ඉවත් වේ. මෙහිදී ප්‍රයෝජනයට ගෙන ඇත්තේ, ජලයේ කවරගුණයද?.

1.මාධ්‍යයක් ලෙස ක්‍රියාකිරීමේ ගුණය 3.ගලායෑමේ ගුණය

2.සිසිලන කාරක ගුණය 4.ද්‍රාවක ගුණය

10. පහත ප්‍රකාශ බලන්න.

a. ගම්මිරිස් ශාකය ආධාරක කඳට සවිවන්නේ ආලග්න මුල් මගිනි.
b. ගැඩවිලා මැඩියා හා නයා අපෘෂ්ඨ වංශී සතුන් වේ.
c.මෝටර් රථ එන්ජිම සිසිල් කිරීමේදී ජලයේ සිසිලකාරක ගුණය ප්‍රයෝජනයට ගනී.
මින් සත්‍ය වනුයේ

1.a පමණි. 2.aහා b පමණි. 3. a හා c පමණි. 4.b හා c පමණි.

11.අපෘෂ්ඨ වංශී සතුන් පමණක් දැක්වෙන්නේ පහත කවර පිළිතුරේද?

1.සමනලයා, නයා, ඉබ්බා   3.කූඩැල්ලා, මකුළුවා, කුරුමිණියා

2.මකුළුවා ,ගෙම්බා, ඉස්සා   4.කූඩැල්ලා,මැඩියා, ගැරඩියා

12.විද්‍යුත් චුම්බක ප්‍රේරණ මූලධර්මය උපයෝගි කරගෙන විදුලිය නිපදවන උපකරණය වන්නේ,

1.බයිසිකල් ඩයිනමෝවයි   3.වියළි කෝෂයයි

2.සූර්යකෝෂයයි   4.සරලකෝෂයයි

13.පිනොප්තලින් බිංදු කීපයක් දැමූවිට රෝස පාටක් ඇති වන්නේ කවර ද්‍රවයේද?

1.විනාකිරි   2. දෙහියුෂ   3.සල්පියුරික් අම්ලය   4.හුණුදියර

14. ධාරිත්‍රකයක් ආරෝපණය කර LED බල්බයක් පහත රූපයේ පරිදි සම්බන්ධ කරන ලදී.

මෙහිදී පහත කවර නිරීක්ෂණය ලැබේද?



1. LED ය දැල්වී නිවී යයි   3. LED ය දිගටම දැල්වේ

2. LED ය නොදැල්වේ   4. LED ය නිවී නිවී දැල්වේ

15.පහත ප්‍රකාශ වලින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

1.මැද බිංදු ගැල්වනෝමීටරයක් මගින් ප්‍රත්‍යවර්තක ධාරාවක් හඳුනා ගත හැකිය.

2.බයිසිකල් ඩයිනමෝවකින් ඇතිවන්නේ සරල ධාරාවකි.

3.කෝෂ කීපයක් නිවැරදිව පිළිවෙලකට සම්බන්ධ කල විට ලැබෙන්නේ බැටරියකි.

4.ඇමීටරයක් මගින් ගලන ධාරා ප්‍රමාණය සොයා ගත හැකිය.

16. මෙහි දැක්වෙන්නේ ඵල වර්ග තුනකි.

හොර

අඹ

වරා

මේවා ව්‍යාප්ත වන ක්‍රම පිළිවෙලින් දක්වා ඇත්තේ කවර පිළිතුරේද?.

1.සුළඟ,සුළඟ,සතුන් 3.සුළඟ, සතුන් , සතුන්

2.සතුන් ,සතුන් , සුළඟ 4. සුළඟ,සතුන් , සුළඟ

17. පහත දැක්වෙන්නේ ශාකයක දැකිය හැකි ලක්ෂණ කීපයකි.

- කඳ අතු බෙදී නැත.
- බීජයක ඇත්තේ බීජ පත්‍ර එකකි.
- තන්තු මූල පද්ධතියක් ඇත .

මෙම ලක්ෂණ දැකිය හැකි ශාක වන්නේ

1.වී, කිතුල් 2.පොල්, මහෝගනී 3. අරලිය ,නාරං 4. පුවක්,දෙල්

18.රසායනික ක්‍රියාවලියක් මගින් විදුලිය නිපදවන උපාංගයක් වනුයේ මින් කවරක්ද?

1.ඩයිනමෝව 2.වියළි කෝෂය 3. සූර්යකෝෂය 4. මෝටරය

19.ඩයිනමෝවක කාර්යක්ෂමතාව වැඩි කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග කීපයක් පහත දැක්වේ.

A. දඟරයේ පොටවල් ගණන වැඩි කිරීම.
B. චුම්බකයේ ප්‍රබලතාව අඩුකිරීම.
C. චුම්බකය චලනය කරන වේගය වැඩි කිරීම.

මින්සත්‍ය වනුයේ ,

1.A හා B 2.A හා C 3.B හා C 4.AB හා C

20.එක්තරා මැඩියෙකු සුදුපාට බිත්තියක රැඳී සිටින විට ලා පාටකින් යුක්ත වූ නමුත් උෟ දුඹුරු පාට දොරකට පැන ටික වේලාවකදී දුඹුරු පාටට හුරු කළු පාටක් ගත්තේය. මෙම සිද්ධිය හැඳින්වීමට සුදුසු පදය වන්නේ,

1. විලෝපීයතාව 3. වේශාන්තරය

2.අනුවර්තනය 4. අනාකූල හැඩය

IIකොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. A අවට පරිසරයේ වැඩෙන ශාක වල මුල් වල විශාල විවිධත්වයක් ඇත.

I. මොණර කුඩුම්බිය හා වී ශාකයේ ඇති මූල පද්ධති වර්ග නම් කරන්න. (ල 2)
II. ශාක මුලකින් ඉටු කෙරෙන ප්‍රධාන කෘත්‍යයක් සදහන් කරන්න. (ල 1)
III. විශේෂ කෘත්‍යයන් ඉටු කෙරෙන මුල් වර්ග ඇති ශාක කීපයක් මෙම රූප වල දැක්වේ.

වැටකෙයියා

ගම්මිරිස්

කිරල

මෙම මුල් වලින් ඉටු කෙරෙන කෘත්‍යයක් බැගින් සදහන් කරන්න. (ල 3)

B ද්‍රව්‍ය එකිනෙක පිරිමැදීම මගින් එම ද්‍රව්‍ය වලට ස්ථිති විද්‍යුත් ආරෝපන ලැබේ.

I. ස්ථිති විද්‍යුත් ආරෝපණ වර්ග දෙක නම් කරන්න. (ල 2)
II. මෙම රූපයේ දැක්වෙන්නේ විජාතීය ආරෝපණ සහිත වස්තූන් දෙකක් ආධාරක වල එල්ලා ඇති ආකාරයයි.



මෙම වස්තූන් දෙක ලං කරන විට කුමක් නිරීක්ෂණය කල හැක්වේද? (ල 2)

III. මෙම රූපයේ දැක්වෙන්නේ ධාරිත්‍රකයක් ආරෝපණය කිරීම සඳහා සකස් කල ඇටවුමක කොටසක් මෙහි දැක්වේ.

(i). මෙහිA B හිඩැසට සම්බන්ධ කල යුත්තේ කුමක්ද? (ල 1)

(ii). ඉහත ධාරිත්‍රකය ආරෝපණය වී තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා සකසන ඇටවුමක රූපයක් අඳින්න.
(ල 3)
(iii) ලැබෙන නිරීක්ෂණය සඳහන් කරන්න. (ල 1)

(iv) එම නිරීක්ෂණයට හේතුව කුමක්ද? (ල 1)

02. A නිවසේදී මෙන්ම විද්‍යාගාරයේදිද විවිධ ද්‍රව්‍ය භාවිතයට ගැනේ. එවැනි ද්‍රව්‍ය කිහිපයක් මෙහි දැක්වේ.

දෙහි යුෂ, නිල් ලිට්මස්, pH කඩදාසි , පිනෝප්තලීන්, හුණු දියර,විනාකිරි

I. මෙහි ඇති ආම්ලික ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ල 2)

II. භාෂ්මික ද්‍රාවණයක් නම් කරන්න. (ල 1)

III. ලුණු ද්‍රවණයට හා දෙහි යුෂ වලට නිල් ලිට්මස් කැබැල්ල බැගින් දැමූ විට ලැබෙන නිරීක්ෂණ වෙන වෙනම ලියන්න. (ල 2)

IV. හුණු දියර වලට මෙහි ඇති ද්‍රව්‍යයක් මිශ්‍ර කල විට රෝස පාටක් ඇතිවේ. එම ද්‍රව්‍යය කුමක්ද? (ල 1)

V. pHකඩදාසි කැබලි දැමූවිට 7ට වඩා වැඩි අංකයක් සහිත වර්ණයක් ලබා දෙන ද්‍රව්‍යයක් සදහන් කරන්න. (ල 1)

B. මෙහි දැක්වෙන ප්‍රකාශ හරි නම්(✓)ලකුණද වැරදි නම්(×)ලකුණද යොදන්න.

I. ගේ කුරුල්ලාගේ ශරීර වර්ණය දුඹුරු පාට පුල්ලි සහිත වීම උෟ වෙනත් සතුන්ට ගොදුරු වීම වැලක්වීමට ඇති අනුවර්ථනයකි. ( )

II. විද්‍යුත් කෝෂයක ධන අග්‍රයට හා ඍණ අග්‍රයට කම්බියක් සම්බන්ධ කල විට ධාරාව ගලන්නේ එක් දිශාවකට පමණි ( )

III. බීජයේ පියළි එකක් සහිත ශාක වල පත්‍ර වල ඇත්තේ ජාලාභ නාරටි වන්‍යාසයකි. ( )

IV. මඤ්ඤොක්කා හා ඩේලියා ශාක වල ආහාර සංචිත කර ඇත්තේ මුදුන් මුලේය ( )

03. එදිනෙදා ජීවිතයේදී බොහෝ කටයුතු සිදු කර ගැනීම සඳහා විදුලිය අපට අත්‍යාවශ්‍ය වේ.



I. විදුලියෙන් අප ගන්නා ප්‍රයෝජන දෙකක් ලියන්න (ලකුණු 2)

II. විද්‍යාගාරයේදි සකස් කරන ලද සරල කෝෂයක කොටසක් මෙහි දැක්වේ.

(a). මෙහි A වශයෙන් යොදා ගත හැකි ලෝහයක් නම් කරන්න. (ලකුණු 1)

(b). ධාරාවක් හට ගන්නේ දැයි පරීක්ෂාකිරීමට x හා y අග්‍ර දෙකට සම්බන්ධ කල හැකි උපකරණයක් නම් කරන්න

(ලකුණු 1)

(c). උපකරණය සම්බන්ධ කල විට ලැබිය හැකි නිරීක්ෂණයක් ලියන්න. (ලකුණු 1)

III. භාවිතයෙන් ඉවත් කළ වියලි කෝෂ 2 ක් මැද බිංදු ගැල්වනෝමීටරයකට සම්බන්ධ කරන ආකාරය මෙම රූපයේ දැක්වේ



(a). මෙහිදී කුමක් නිරීක්ෂණය කල හැකිද? (ල 2)

(b). කෝෂයේ අග්‍ර මාරු කර සම්බන්ධ කල විට ලැබෙන නිරීක්ෂණය කුමක්ද? (ල 2)

(c). මෙහි ඇති කම්බිය තුළින් ගලා යන්නේ කවර වර්ගයේ ධාරාවක්ද? (ල 1)

IV. බයිසිකල් ඩයිනමෝවකින් හටගන්නේ කවර ධාරාවක්ද? (ල 1)

04. A. පහත දී තිබෙන වචන වලින් සුදුසු වචන යොදා ගෙන හිස්තැන් පුරවන්න

I. හී රැස්ස ශාකය .... කඳක් සහිත ශාකයකි

II. වදකහ,ඉඟුරු,හබරල ආදිය .... කඳන් සහිත ශාකවේ.

III. වැල් දොඩම් ශාකයේ පත්‍ර වල ඇත්තේ .... නාරටි වන්‍යාසයකි

IV. බඩ ඉරිඟු ශාකය ප්‍රරෝහණය වන විට ....පොලවෙන් ඉහලට මතු නොවේ

V. ලෝම වලින් පිරිමදින ලද එබනයිට් වලට ....ස්ථිති විද්‍යුත් ආරෝපණයක් ලැබේ

VI. ඔක්සිජන් කාබන්ඩයොක්සයිඩ් වැනි වායු ජලයේ මිශ්‍ර වී තිබෙන්නේ ජලය සතු...නිසාය.

(ද්‍රාවක ගුණය , ප්‍රභාසංස්ලේෂී, ආරෝහක, භූගත, සමාන්තර , ජාලාභ, බීජ පත්‍ර, ධන, සජාතීය, ඍණ, සිසිලන කාරක ගුණය)

B. Pහා Q කොටස් වල තිබෙන ඒවායේ යම් සම්බන්ධතාවක් ඇත. ඒසේ ගැලපෙන ඒවා යා කරන්න.

P	Q
(i). ශරීරය තුල ද්‍රව්‍ය පරිවහණය	අනාකූල හැඩය
(ii). වාතයේ ප්‍රතිරෝධය මැඩ ඉදිරියට යාම	ස්ථිති විද්‍යුතය
(iii). ආමාශයේ ගැස්ට්‍රයිටිස් තත්වය අතිවීම	රුධිරය
(iv). වැසි දිනවල අකුණු හට ගැනීම	වේශාන්තරය
(v). හරිත පැහැ වනාන්තරයක කොල පැහැ ජීවීන් බහුල වීම	හයිඩොක්ලෝරික් අම්ලය

05. ශාකයක හට ගන්නා පුෂ්පයක කෘත්‍ය වනුයේ ඵල හට ගන්වා තම වර්ගයා බෝ කිරීමයි. පුෂ්පයක කොටස් මෙහි දැක්වේ.



I. bහා c කොටස් නම් කරන්න (ලකුණු 1)

II. බීජ හට ගන්නේ c වල ඇති කුමන කොටස් මගින්ද? (ලකුණු 1)

III. d වල කෘත්‍යය කුමක්ද? (ලකුණු 1)

IV. මෙම පුෂ්පයේ තිබුණේ පෙති පහකි. මෙය ඒක බීජ පත්‍ර ශාකයක පුෂ්පයක්ද? නැතහොත් ද්විබීජ පත්‍ර ශාකයක පුෂ්පයක්ද? (ලකුණු 1)

B පුෂ්පයක ඵල හා බීජ හට ගත් පසු ඒවා ව්‍යාප්ත විය යුතුය.

I. ඵල හා බීජ ව්‍යාප්තියට උදව් කරන බාහිර කාරක දෙකක් වන්නේ සතුන් හා සුළඟයි.

a. අඹ බීජය ව්‍යාප්ත වන්නේ කවර කාරකය මගින්ද? (ලකුණු 1)

b. ඔබ සඳහන් කල ක්‍රමයට ව්‍යාප්ත වීමට අඹ ඵලයේ ඇති අනුවර්ථනයක් ලියන්න (ලකුණු 2)

c. මෙහි දැක්වෙන ඵලය හඳුනා ගන්න.

මෙය ව්‍යාප්ත වනු ඇත්තේ කවර ක්‍රමයටද? (ලකුණු 1)

II.පහත සඳහන් ශාක තම වර්ගයා බෝ කරන්නේ කවර කොටස් මගින්ද?

a. බතල (ලකුණු 1)

b. කරපිංචා (ලකුණු 1)

c. අරලිය (ලකුණු 1)

06.A ජීවීන්ගේ යම් ලක්ෂණයක් පදනම් කරගෙන එම ලක්ෂණය ඇති හෝ නැති බව අනුව ජීවීන් වර්ග කිරීම දෙබෙදුම් සුචියක් ලෙස හැඳින්වේ. මෙහි දැක්වෙන හිස්තැන් පුරවන්න. (ල 05)



B. බයිසිකල් ඩයිනමෝවක ඇතුලත ව්‍යුහයේ දළ රූප සටහනක් මෙහි දැක්වේ.



I. X හා Y නම් කරන්න. (ලකුණු 2)

II. බයිසිකලයේ ලාම්පු(බල්බ)දැල්වීම සඳහා රළු හිස ස්පර්ශව තැබිය යුත්තේ බයිසිකලයේ කවර කොටසද? (ලකුණු 1)

III. බයිසිකලය වේගයෙන් පදින විට විදුලි පහනේ දීප්තියේ සිදුවන වෙනස කුමක්ද?(ලකුණු 2)

IV. ඩයිනමෝවේ සන්නායක අග්‍ර දෙකට මැද බිංදු ගැල්වනෝමීටරයක් සවි කර රළු හිස කැරකූ විට ලැබෙන නිරීක්ෂණය සඳහන් කරන්න . (ලකුණු 1)

රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
පළමු වාර පරීක්ෂණය - 2020
First Term Test - 2020

විද්‍යාව **කාලය පැය එකයි මිනිත්තු තිහයි.**

නම / අංකය : .... **7 ශ්‍රේණිය**

I කොටස

* **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* **වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

(01) මූල ගැටිති සහිත ශාකයක් නොවන්නේ,
(i) බෝංචි (ii) කතුරු මුරුංගා (iii) මෑ (iv) හාතවාරිය

(02) ජාලාභ නාරටි වින්‍යාසයක් සහිත පත්‍ර දරන ශාකයක් නොවන්නේ,
(i) තෘණ (ii) ගොටුකොල (iii) කොස් (iv) අඹ

(03) කරකැවීමෙන් හෝ චලනය කිරීම මගින් විදුලිය නිපදවන ක්‍රමයක් නොවන්නේ,
(i) බයිසිකල් ඩයිනමෝව (ii) සූර්ය කෝෂ
(iii) විදුලි ජනක යන්ත්‍රය (iv) සුළං මෝල

(04) පත්‍ර වලින් තම වර්ගයා බෝ කරන ශාක යුගලය තෝරන්න.
(i) අක්කපාන - ගොඩපර (ii) බිගෝනියා - අක්කපාන
(iii) කැනාස් - ඩේලියා (iv) වද - රෝස

(05) භූගත කඳක් වන්නේ,
(i) බීට් (ii) රාබු (iii) අර්තාපල් (iv) බතල

(06) නිදිකුම්බා ශාකයේ මූල ගැටිති තුළ සිටින ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය වනුයේ,
(i) වෛරස් (ii) බැක්ටීරියා (iii) දිලීර (iv)ඇල්ගී

(07) ශාක පත්‍රයක කෘත්‍යයක් නොවන්නේ,
(I). ජලය ගබඩා කර ගැනීම.
(II). ප්‍රභාසංස්ලේෂණය කිරීම.
(III). ආහාර ගබඩා කිරීම.
(IV). තම වර්ගයා බෝ කිරීම.

(08) ස්ථිති විද්‍යුතය සම්බන්ධ සංසිද්ධියක් වන්නේ,
(i) අකුණු ඇති වීම. (ii) සුළඟ ඇති වීම.
(iii) විදුලි පංකාව ක්‍රියාකිරීම. (iv) රෙදි මැදීම.

(09) ධාරාව මනින සම්මත ඒකකය වනුයේ,
(i) ඇම්පියර් (ii) මිලි ඇම්පියර් (iii) මයික්‍රො ඇම්පියර් (iv)වොල්ට්

(10) මෙවැනි මුල් පද්ධතියක් සහිත ශාකය වනුයේ,



(i) මෑ (ii) මොනරකුඩුම්බිය.
(iii) තල්. (iv) බෙලි

(11) ධන (+) හා සෘණ (-) ලෙස ආරෝපිත වස්තු දෙකක් එකිනෙකට ස්පර්ශ වූ විට.
(I). වස්තු දෙකම ධන ලෙස ආරෝපණය වේ.
(II). වස්තු දෙකම සෘණ ලෙස ආරෝපණය වේ.
(III). එක් වස්තුවක් ධන ලෙසත් අනෙක් වස්තුව සෘණ ලෙසත් ආරෝපණය වේ.
(IV). වස්තු දෙකම මත විද්‍යුත් ආරෝපණයක් ඇති නොවේ.

(12) වායු ගෝලයේ ඇති ජල වාෂ්ප අවශෝෂණය කරන මුල් විශේෂය වනුයේ,
(i) වායුධර මුල්ය. (ii) කරු මුල්ය.
(iii) මුදුන් මුල්ය. (iv) වායව මුල්ය.

(13) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(I). ඔක්සිජන් හා කාබන්ඩයොක්සයිඩ් වැනි වායු වර්ග ජලයේ දියවේ.
(II). රෙදි පිළිවල තැවරුණු දැ සෝදා හැරිය හැක්කේ ජලයේ ද්‍රාවක ගුණය නිසාය.
(III). යන්ත්‍ර ක්‍රියාකරන විට නිපදවන තාපය ඉවත්කරගත හැක්කේ ජලයේ ද්‍රවක ගුණය නිසාය.
(IV). අයිස් කැටයක් අතට ගත් විට සිසිලසක් දැනෙන්නේ ජලයේ සිසිලනකාරක ගුණය නිසාය.

(14) වස්තුවකින් සෘණ ආරෝපිත අංශු ඉවත් වූ විට එම වස්තුව,
(I). ධන ලෙස ආරෝපණය වේ.
(II). සෘණ ලෙස ආරෝපණය වේ.
(III). උදාසීන වේ.
(IV). ඉහත කිසිවක් සිදුනොවේ.

(15) රසායනික කෝෂයක් නොවන්නේ,
(I). සරල කෝෂ.
(II). වියළි කෝෂ.
(III). ක්ෂාර කෝෂ.
(IV). ඩයිනමෝව.

(16) වීදුරු දණ්ඩක් සේද රෙද්දකින් පිරිමැදීමේදී එක් එක් ද්‍රව්‍යයට ලැබෙන ආරෝපණ වර්ගය වනුයේ,
(I). වීදුරු දණ්ඩ ධන (+) , සේද රෙද්ද සෘණ (-) ආරෝපිත.
(II). වීදුරු දණ්ඩ සෘණ (-) , සේද රෙද්ද ධන (+) ආරෝපිත.
(III). වීදුරු දණ්ඩ සෘණ (-) , සේද රෙද්ද සෘණ (-) ආරෝපිත
(IV). වීදුරු දණ්ඩ ධන (+) , සේද රෙද්ද ධන (+) ආරෝපිත.

(17) තක්කාලි, දෙහි, විනාකිරි හා බිලිං වැනි දේවල් ඇඹුල් රසට හේතුව වනුයේ ඒවායේ කවර රසායනික ද්‍රව්‍යයක් අන්තරගත නිසාද?
(i) අම්ල (ii) භෂ්ම (iii) ක්ෂාර (iv) ලවණ

(18) මෙම පත්‍රය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(I). සරල පත්‍ර ජාලාභ නාරටි වින්‍යාසය.
(II). සරල පත්‍ර සමාන්තර නාරටි වින්‍යාසය.
(III). සංයුක්ත පත්‍ර ජාලාභ නාරටි වින්‍යාසය.
(IV). සංයුක්ත පත්‍ර සමාන්තර නාරටි වින්‍යාසය.



(19) මෙම රූපයේ දක්නට ඇති මුල් වර්ගය වන්නේ,
(i) කයිරු මුල් (ii) ආලග්න මුල්
(iii) කරු මුල් (iv) ශ්වසන මුල්



(20) විදුලි අර්බුදයට විසඳුමක් නොවන්නේ,
(I). විකල්ප බල ශක්ති භාවිතය වැඩිකිරීම.
(II). විදුලි බිල වැඩි කිරීම.
(III). විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම.
(IV). විදුලි බල සංරක්ෂණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.

(ලකුණු 20 x 2 = 40)

II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

* පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(01) 7 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් ක්ෂේත්‍ර චාරිකාවක නිරතවීමෙන් පසු ඔවුන් විසින් රැගෙන ආ ශාක බීජ දෙවර්ගයක ප්‍රරෝහණය පෙන්වීම සඳහා යොදාගත් රූප සටහන් දෙකක් පහත දැක්වේ.



ඒක බීජ පත්‍රී බීජයක ප්‍රරෝහණය



ද්වී බීජ පත්‍රී බීජයක ප්‍රරෝහණය

(I). ඉහත බීජ ප්‍රරෝහණය ආකාර දෙක සඳහා වෙන වෙනම උදාහරණ ශාක දෙක බැගින් ලියන්න.(ලකුණු 02)

(II). ඒක බීජ පත්‍රී බීජයක ප්‍රරෝහණය හා ද්වීබීජ පත්‍රී බීජයක ප්‍රරෝහණය දැකිය හැකි ප්‍රධාන වෙනස්කමක් සඳහන් කරන්න. (ලකුණු 02)

(III). ඒක බීජ පත්‍රී හා ද්වී බීජ පත්‍රී ශාක වල වෙනස්කම් පහත පරිදි වගුවක දක්වන්න.

අංගය	ඒක බීජ පත්‍රී ශාක	ද්වී බීජ පත්‍රී ශාක
මුල් කඳ		

(ලකුණු 2 x 4 = 8)

(IV). කෙටි පිළිතුරු සපයන්න.

(a) විද්‍යාගාරයේ භාවිත වන අම්ල වර්ග දෙකක් ලියන්න.

(b) වියළි කෝෂයක අඩංගු ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(c) කයිරු මුල් මගින් ශාකයට ඇති ප්‍රයෝජනය කුමක්ද?

(d) ස්ථිති විද්‍යුතය පිළිබඳ මුලින්ම පර්යේෂණ කළ විද්‍යාඥයා කවුද? (ලකුණු 1 x 4 = 4)

(02) පාසලේ ක්‍රියාකාරකමකදී සාදන ලද සරල ධාරිත්‍රකයක් පහත රූපයේ දැක්වේ.



(I). A හා B කොටස් නම් කරන්න. (ලකුණු 02)

(II). මෙම සරල ධාරිත්‍රකය වියළි කෝෂ දෙකකට සම්බන්ධ කළ ආකාරය පහත දැක්වේ. (ලකුණු 02)



a. මෙය සම්මත සංකේත භාවිතකර ඇඳ දක්වන්න. (ලකුණු 02)

b. තත්ත්පර කිහිපයකින් පසු කෝෂ ඉවත් කර ඒ වෙනුවට මැද බිංදු ගැල්වනෝමීටරයක් සම්බන්ධ කළේ නම් දැකිය හැකි නිරීක්ෂණයක් ලියන්න. (ලකුණු 02)

c. (b) හි සඳහන් සිදුවීම කුමන නමකින් හැඳින්වේද? (ලකුණු 02)

(III). ධාරිත්‍රකයක ගබඩා කළ හැකි ආරෝපණ මනිනු ලබන ඒකකය කුමක්ද? (ලකුණු 02)

(IV). ධාරිත්‍රක දැකිය හැකි උපකරණ දෙකක් ලියන්න. (ලකුණු 01)

(03) විද්‍යුත් ප්‍රභව විසින් නිපදවන විදුලි ධාරාව සම්බන්ධව සිදුකරන ලද ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ.





(I). A ඇටවුමේ කෝෂ සම්බන්ධ කළ විට මැද බිංදු ඇමීටරයේ දැකිය හැකි නිරීක්ෂණ මොනවාද? (ලකුණු 02)

(II). B ඇටවුමේ ඩයිනමෝව කැරකැවීමේදී මැද බිංදු ඇමීටරයේ දැකිය හැකි නිරීක්ෂණ මොනවාද? (ලකුණු 02)

(III). A ඇටවුමේ නිරීක්ෂණ සඳහා හේතුව පැහැදිළි කරන්න. (ලකුණු 02)

(IV). B ඇටවුමේ නිරීක්ෂණ සඳහා හේතුව පැහැදිළි කරන්න. (ලකුණු 02)

(V). A හා B ඇටවුම් වල විද්‍යුත් ප්‍රභව නිපදවන ධාරාව කාලය සමඟ ප්‍රස්ථාරගත කර දක්වන්න. (ලකුණු 03)





(04) ජීවීන්ට තම ජීවිතය පවත්වා ගැනීමට ජලය අත්‍යවශ්‍යය වේ. මේ සඳහා ජලය සතු සුවිශේෂී ගුණ උපකාරී වේ.

(I). පහත කාර්යයන් සඳහා වැදගත් වන ජලයේ සුවිශේෂී ගුණය ලියන්න.

a. වාහන එන්ජිම සිසිල්කිරීමට ජලය යොදා ගැනීම.
b. සිරුරේ සෛල තුල නිපදවන යූරියා වැනි බහිස්‍රාවීය ද්‍රව්‍ය බැහැර කරන ස්ථාන කරා පරිවහනය කිරීම.
c. උණුසුම් වේලාවට මී හරකුන් වැනි සතුන් ජලයේ ලැග සිටීම.
d. ජලජ ජීවීන්ට ශ්වසනයට අවශ්‍යය ඔක්සිජන් ජලයෙන් ලබා ගැනීම.

(ලකුණු 04)

(II). ජලජ පරිසරයක ජීවත්වන

a. ශාකයක්
b. සත්වයෙක්
c. ක්ෂුද්‍ර ජීවියෙකු නම් කරන්න.

(ලකුණු 03)

(III). ජලයේ දියවී ඇති දෑ වෙන්කර ගැනීම ප්‍රයෝජනවත්වන අවස්ථා දෙකක් ලියන්න.

(ලකුණු 02)

(IV). පහත ද්‍රව්‍ය සපයා ඇත් නම්,
(හුණු දියර, දෙහි යුෂ)

a. නිල් ලිට්මස් රතු පාටට හරවන දියරය කුමක්ද? (ලකුණු 01)
b. පිනෝප්තැලීන් රෝස පාටට හරවන දියරය කුමක්ද? (ලකුණු 01)

(05)



(I). පුෂ්පයක දැකිය හැකි ජායාංගයට හා පුමාංගයට අයත් කොටස් වෙන වෙනම ඇඳ කොටස් නම් කරන්න. (ලකුණු 04)

(II). පුෂ්පයක පසු කලක ඵලය බවට පත්වන්නේ කුමන කොටසද? (ලකුණු 02)

(III). මනිපත්‍ර මගින් සිදුකරන ප්‍රධාන කාර්යය කුමක්ද? (ලකුණු 02)

(IV). පුෂ්පයක කොටස් හඳුනා ගැනීමට සුදුසුම පුෂ්පය ලෙස වදමල හැදින්විය හැක්කේ ඇයි? (ලකුණු 01)

(V). මධු කෝෂ සහිත පුෂ්ප දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(06) රූපයේ දැක්වෙන්නේ බයිසිකල් ඩයිනමෝවක රූප සටහනකි.



(I). මෙහි A,B හා C නම් කරන්න. (ලකුණු 03)

(II). මෙහිදී නිපදවන විද්‍යුත් ධාරාව වැඩිකර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 04)

(III). මෙහිදී විදුලිය නිපදවීමේ ක්‍රමය හඳුන්වන නම කුමක්ද? (ලකුණු 02)

(IV). ඩයිනමෝව තුළ සිදුවන ශක්ති පරිවර්තනය ලියන්න. (ලකුණු 02)

(07) විදුලිය නිපදවීම සඳහා විද්‍යාගාරයේදී සකසන ලද සරල කෝෂයක් මෙහි දැක්වේ.

A.

I. A හා B ලෙස යොදාගත හැකි ලෝහ වර්ග දෙක මොනවාද? (ලකුණු 02)

II. C ද්‍රාවණය නම් කරන්න. (ලකුණු 02)

III. මෙම කෝෂයේ ඇති දෝෂ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)



B. පහත දී ඇති ශාක අතරින් සුදුසු පිළිතුරු තෝරා ලියන්න.

මදුවැල්, මඬු, නිදිකුම්බා, අඹ
රම්පේ, කැරට්, බේදුරු, මාර

I. ඉහත ශාක අතරින් පුෂ්ප හටනොගන්නා ශාකයක් නම් කරන්න.

II. දුර්වල කඳක් සහිත ශාකයක් ලියන්න.

III. ආහාර සංචිත මුලක් සහිත ශාකයක් ලියන්න.

IV. සංයුක්ත ශාක පත්‍ර සහිත ශාකයක් ලියන්න.

V. ශාක කඳට අමතර ආධාරකයක් ලෙස ක්‍රියාකරන මුල් සහිත ශාකයක් ලියන්න.

(ලකුණු 1 x 5 = 5)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 34 S I

විද්‍යාව I

කාලය පැය දෙකයි

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

I කොටස

01. ශාකයක ප්‍රධාන කොටස් හඳුනා ගැනීම සඳහා වියළා, තෙරපා ක්ෂේත්‍ර පොතේ ඇලවීමට වඩාත් සුදුසු ශාකය තෝරන්න.
1. අඹ ශාකය 2. කුප්පමේනිය ශාකය 3. එළබටු ශාකය 4. ක්‍රෝටන් ශාකය

02. දකුණු පසින් ඇති රූපයේ දැක්වෙන ශාකයේ පැවතිය **නොහැකි** ලක්ෂණය කුමක් විය හැකිද?



1. මුදුන් මුලක් පැවතීම.
2. කඳ අතු බෙදී තිබීම.
3. බීජයේ පියලි දෙකක් තිබීම.
4. පත්‍රවල සමාන්තර නාරටි වින්‍යාසයක් තිබීම.

03. චලනය මගින් විද්‍යුතය නිපදවන විද්‍යුත් ප්‍රභවය පහත සඳහන් පිළිතුරු අතරින් කුමක්ද?
1. සූර්ය කෝෂය 2. වියලි කෝෂය
3. සරල කෝෂය 4. බයිසිකල් ඩයිනමෝව

04. ප්‍රත්‍යාවර්ත විදුලි ධාරාවක් භාවිත කර ක්‍රියාත්මක කරන උපකරණය කුමක්ද?
1. බිත්ති ඔරලෝසුව 2. සෙල්ලම් මෝටර් රථය
3. පාපැදියක ප්‍රධාන ලාම්පුව 4. ජංගම දුරකථනය

05. අම්ල භෂ්ම සමග වෙනස් වර්ණ ලබා දෙන ද්‍රව්‍ය හඳුන්වන්නේ,
1. දර්ශක ලෙස ය. 2. ලවණ ලෙස ය. 3. අම්ල ලෙස ය. 4. භෂ්ම ලෙස ය.

06. මෙම ශාකයේ අතුවලින් හටගෙන පහළට වර්ධනය වී ඇති මුල්වලින් ඉටුවන කාර්යයක් වනුයේ,

1. කඳට ආධාරකයක් ලෙස ක්‍රියාකිරීම.
2. අතුවලට ආධාරකයක් ලෙස ක්‍රියාකිරීම.
3. වායුගෝලයෙන් ඛනිජ ලවණ අවශෝෂණය
4. සංචිත මුල් ලෙස ක්‍රියාත්මක වීම.

07. පුෂ්පවල පැවතිය හැකි ලක්ෂණ කීපයක් පහත දැක්වේ. ඒවා අතරින් රාත්‍රි පිපෙන පුෂ්පවල දැකිය හැක්කේ කවර ලක්ෂණ දැයි තෝරන්න.

A. සුදුපාට වීම	B. සුගන්ධවත් වීම
C. දළ පත්‍ර නොපිහිටීම	

1. A පමණි. 2. B හා C පමණි. 3. A හා B පමණි. 4. A, B හා C සියල්ලමය.

08. දිවියාගේ ශරීරය දුඹුරු පැහැති වීම සහ පුල්ලි පිහිටීම නිසා වෙනත් සතුන්ට වඩාත් පහසුවෙන් හඳුනා ගත නොහැකිවේ. මෙසේ පරිසරයට අනුවර්තනය වී තිබීම හඳුන්වන්නේ,
1. පර්යටනය ලෙස ය. 2. වේශාන්තරය ලෙස ය. 3. රූපාන්තරණය ලෙස ය. 4. කාලතරණය ලෙස ය.

09. ස්ථිති විද්‍යුතය භාවිතයට ගන්නා අවස්ථාව විය හැක්කේ,
1. විදුලි පංකාවක් ක්‍රියාත්මක වීම. 2. ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාත්මක වීම.
3. ආලෝක විමෝචන ඩයෝඩයක් දැල්වීම. 4. සූර්ය කෝෂයක් ක්‍රියාත්මක වීම.

10. පුෂ්පයක නිරීක්ෂණය කළ හැකි ව්‍යුහයක් රූපයේ දැක්වේ. එහි A, B, C යනු පිළිවෙලින්,
1. කලංකය, කීලය, ඩිම්බකෝෂය
2. කලංකය, ඩිම්බකෝෂය, කීලය
3. කීලය, කලංකය, ඩිම්බකෝෂය
4. කලංකය, සූත්‍රිකාව, ඩිම්බකෝෂය



11. දෙහියුෂ, විනාකිරි, සබන් දියර හා හුණු දියර මිලි ලීටර් 2 බැගින් පරීක්ෂණ නළවලට ගන්න. ඒවාට රතු වද මල් තම්බා ලබා ගත් යුෂ ස්වල්පය බැගින් එකතු කරයි. එවිට දැකිය හැකි නිවැරදි නිරීක්ෂණය වනුයේ,
1. විනාකිරි රතුපාට වීම
2. දෙහියුෂ නිල්පාට වීම
3. සබන් දියර කහ පාට වීම
4. හුණු දියර අවර්ණ වීම.

12. කුඩා විදුලි පන්දම් බල්බයක් සවි කළ සරල කෝෂයක් සම්බන්ධව සත්‍ය ප්‍රකාශය කුමක්ද?
1. ඍණ අග්‍රය ලෙස තඹ තහඩුව ක්‍රියාත්මක වේ.
2. බල්බය නිවි නිවී දැල්වෙමින් පවතී.
3. සල්ෆියුරික් අම්ලය ක්‍රමයෙන් රතු පැහැයට හැරේ.
4. සින්ක් තහඩුව දියවේ.

13. නිල් ලිට්මස් දැමූ විට සමාන වර්ණ වෙනස්වීමක් පෙන්වන ද්‍රව්‍ය **පමණක්** ඇති පිළිතුර තෝරන්න.
1. ජලය, හයිඩ්‍රොක්ලෝරික්, දෙහි යුෂ
2. දෙහි යුෂ, විනාකිරි, තක්කාලි යුෂ
3. හයිඩ්‍රොක්ලෝරික්, සබන් දියර, ශල්‍ය ස්ප්‍රීතු
4. සබන් දියර, ශල්‍ය ස්ප්‍රීතු, ජලය

14. භස්ම ද්‍රාවණයකට පිනෝප්තලින් බිංදුවක් දැමූ විට සිදුවන වර්ණ විපර්යාසය වනුයේ,
1. අවර්ණ වීම ය.
2. කහපාට වීම ය.
3. රෝසපාට වීම ය.
4. නිල්පාට වීම ය.

15. විටමින්, ඛනිජ ලවණ, ඖෂධ වැනි දෑ, අප සිරුරේ, අවශ්‍ය ස්ථානවලට පරිවහනය කරන්නේ රුධිරය මගිනි. මෙහිදී රුධිරයේ ඇති ජලය ක්‍රියාකරන්නේ,
1. ද්‍රාවකයක් ලෙසය.
2. සිසිලන කාරකයක් ලෙසය.
3. මාධ්‍යයක් ලෙසය.
4. පරිවාරකයක් ලෙසය.

16. සතුන්ගේ දක්නට ලැබෙන ආරක්ෂක චර්යා උපාය මාර්ගයක් **නොවන්නේ,**
1. හූණා වලිගය කඩාදැමීම.
2. ඉබ්බා කටුව තුළට රිංගා ගැනීම.
3. පලා පොළඟා හැව හැරීම.
4. ඇහැටුල්ලා කොළ පැහැති පඳුරු අතර සිටීම.

17. පියඹා යාම යන සංචරණ ක්‍රමය පදනම් කරගත් ක්ෂීරපායි සතෙකු විය හැක්කේ,
1. වවුලාය.
2. සමනලයාය
3. කපුටාය.
4. බත් කූරාය.

18. ජලයේ හොඳින් දියවෙන ද්‍රව්‍යය ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ග්ලූකෝස්, කොන්ඩිස් කැට, නිල්කුඩු
2. භූමිතෙල්, පොල්තෙල්, ලුණු
3. ආප්ප සෝඩා, කහ කුඩු, විනාකිරි
4. ශල්‍ය සප්‍රීතු, ලුණු, විනාකිරි

19. වියළි කෝෂ දෙකකට ආලෝක විමෝචක ඩයෝඩ දෙකක් සවිකර ඇති අවස්ථාවක් පහත දැක්වේ. නිවැරදි නිරීක්ෂණය සහිත වරණය තෝරන්න.



1. LED දෙකම දැල්වේ.
2. LED දෙකම නොදැල්වේ.
3. LED - 1 දැල්වේ. LED - 2 නොදැල්වේ.
4. LED - 1 නොදැල්වේ. LED - 2 දැල්වේ.

20. විද්‍යා ගුරුතුමා විසින් සකස් කරන ලද සරල විද්‍යුත් ප්‍රභවයක් පහත දැක්වේ.



මැද බින්දු ගැල්වනෝමීටරයේ නිරීක්ෂණයක් ලබාගැනීමට කඩදාසිය පෙඟ වීමට සුදුසු ද්‍රව්‍යය වන්නේ,
1. භූමිතෙල්
2. ආසුත ජලය
3. ශල්‍ය සප්‍රීතු ද්‍රාවණය
4. විනාකිරි ද්‍රාවණය

21. අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. සේද වලින් පිරිමදින ලද වීදුරු දණ්ඩට ධන ආරෝපණයක් ලැබේ.
   2. ලෝම වලින් පිරිමදින ලද එබනයිට් දණ්ඩට ධන ආරෝපණයක් ලැබේ.
   3. ලෝම වලින් පිරිමදින ලද එබනයිට් දණ්ඩට සෘණ ආරෝපණයක් ලැබේ.
   4. සේද වලින් පිරිමදින ලද PVC දණ්ඩට සෘණ ආරෝපණයක් ලැබේ.

22. පහත දැක්වෙන්නේ ඵල තුනක රූප සටහන්ය.

හොර	කජු	පොල්

මේවා ව්‍යාප්ත වන නිවැරදි ක්‍රම ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
1. සුළඟ, සතුන්, ජලය   2. සුළඟ, ජලය, සතුන්   3. සතුන්, ජලය, සුළඟ   4. ජලය, සතුන්, සතුන්

23. පත්‍ර තලය නොබෙදුණු හා බෙදී ඇති ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

පිළිතුරු අංකය	පත්‍ර තලය බෙදී නොමැති ශාකයකි	පත්‍ර තලය අර්ධ ලෙස බෙදී ඇති ශාකයකි	පත්‍ර තලය සම්පූර්ණයෙන් බෙදී ඇති ශාකයකි
1.	මුරුංගා	පැපොල්	කරපිංචා
2.	බුලත්	මෑ	මඤ්ඤොක්කා
3.	අඹ	දෙල්	පොල්
4.	හබරල	බතල	තල්

24. කුඩා ප්‍රමාණයේ ඉරටු කැබලි සියයක් පමණ රතු, කොළ, කහ, දුඹුරු වර්ණ වලින් වර්ණ ගන්වා ගනු ලැබේ. තණකොළ සහිත පිට්ටනියක සීමිත කොටසක මේවා විසුරුවා හරියි. ළමුන් දෙදෙනෙකුට සීමිත කාලයක් තුළදී හැකිතාක් මෙම ඉරටු කැබලි ඇහිදීමට යොමු කරයි. අවසානයට ළමුන් ඇහිදීම සිදු කරන්නේ කවර වර්ණයේ ඉරටු කැබලිද?
1. කොළ පාට ඉරටු   2. කහ පාට ඉරටු   3. රතු පාට ඉරටු   4. දුඹුරු පාට ඉරටු

25. පහත සඳහන් වන්නේ සිසු දරුවෙක් වේශාන්තරයේ වාසි ලියා තිබූ ආකාරයයි.
   A. විලෝපියන්ට පහසුවෙන් දර්ශනය නොවී ආරක්ෂා වීමට.
   B. ගොදුරු පහසුවෙන් සොයා ගැනීමට.
   C. ඉතා වේගවත් සංචරණයක් සිදු කිරීමට.

මේවා අතරින් නිවැරදි පිළිතුරු මොනවාද?
1. B හා C පමණි.   2. A හා C පමණි.   3. A හා B පමණි.   4. A,B,C සියල්ලම.

* * * * *

II කොටස

උපදෙස් :
- **පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සපයන්න. ඉතිරි ප්‍රශ්න 05 න් ඔබ කැමති ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමට වෙනම කඩදාසි භාවිත කරන්න.)**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.**

01) 7 වන ශ්‍රේණියේ සිසුන් පිරිසක් ක්ෂේත්‍ර චාරිකාවක දී හඳුනා ගත් ශාක කිහිපයක් සහ එම ශාක සංඛ්‍යාව පහත ස්ථම්භ ප්‍රස්තාරයෙන් දක්වා ඇත.



මෙම ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) i. ක්ෂේත්‍ර චාරිකාවේ දී වැඩිපුර ම හමු වූ ශාකය කුමක්ද? (ල. 01)

ii. අතු නොබෙදුණු කඳක් සහිත ශාකයක් ලියන්න. (ල. 01)

iii. සංයුක්ත පත්‍ර සහිත ශාකයක් ලියන්න. (ල. 01)

iv. පුෂ්ප හට නොගන්නා ශාකය කුමක්ද? (ල. 01)

v. මූල ගැටිති සහිත ශාකය නම් කරන්න. (ල. 01)

vi. ජලය මගින් බීජ ප්‍රචාරණය වීමට අනුවර්තන දක්වන ශාක මෙහි දී හමුවිය. එම ශාකයක් නම් කරන්න. (ල. 01)

vii. මෙහි ඇති ඒක බීජ පත්‍රී ශාක කුමක් ද? (ල. 01)

viii. සුළඟ මගින් ප්‍රචාරණය වන බීජ සහිත ශාකය හා එය, ඒ සඳහා දක්වන අනුවර්තනය කුමක්ද? (ල. 02)

(ආ)



රූපයේ දැක්වෙන්නේ පුෂ්පයක පුමාංගී කොටස යි.

i. මෙහි කෘත්‍යය කුමක්ද? (ල. 01)

ii. මෙහි x හා y කොටස් දෙක නම් කරන්න. (ල. 01)

02) (අ) මුහුදු වෙරළ ආශ්‍රිතව ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරතවූ සිසුන් පිරිසකට හමුවූ සතුන් කිහිප දෙනෙක් පහත දැක්වේ.

මුහුදු ලිහිණියා, සාලයා, කැස්බෑවා මුහුදු බෙල්ලා, මුහුදු මල

i. ඉහත සතුන්ගේ බාහිර ලක්ෂණ පමණක් උපයෝගි කරගෙන දෙබෙදුම් සුවියකින් වර්ග කිරීමට ගත් උත්සාහයක් පහත දැක්වේ. එහි හිස්තැන් වලට අදාළ පිළිතුර සඳහන් කරන්න.



(ල. 04)

ii. මුහුදු බෙල්ලා සහ මුහුදු මල වෙන් කිරීමට සුදුසු, ඉහත දෙබෙදුම් සුවියේ **නොමැති** බාහිර ලක්ෂණයක් ලියන්න. (ල. 01)

iii. දෙබෙදුම් සුවියට ඇතුළත් කර ඇති සතුන් අතරින් අපෘෂ්ඨවංශි සත්ත්වයින් දෙදෙනෙකු ලියන්න. (ල. 01)

iv. මුහුදු ලිහිණියා ජීවත්වන පරිසරයට දක්වන අනුවර්තනයක් ලියන්න (ල. 01)

v. මුහුදු බෙල්ලාගේ ආරක්ෂක අනුවර්තනයක් සඳහන් කරන්න. (ල. 01)

vi. දෙබෙදුම් සුවියේ සඳහන් සතුන් අතරින් අනාකුල හැඩයක් දරණ සතුන් දෙදෙනෙකු නම් කරන්න. නම ඉදිරියෙන් එක් එක් සත්ත්වයා හා එම හැඩයෙන් අත්කරගන්නා වාසිය ලියන්න. (ල. 02)

(ආ) සංචරණය සඳහා ශරීර හැඩය වැදගත්වන ආකාරය සොයා බැලීම සඳහා පන්ති කාමරයේ සිදුකළ ක්‍රියාකාරකමක රූපය පහත දැක්වේ.



i. ඉහත A හා B බණ්ඩක්කා ව්‍යුහ දෙකම එකවර අතහැරිය විට වඩා වේගයෙන් ගමන් කරන්නේ කුමන අකාරය දරණ ව්‍යුහයද? (ල. 01)

ii. ඔබ ඉහත I හි සඳහන් කළ පිළිතුරට හේතුව කුමක්ද? (ල. 01)

03) i. ජලය ද්‍රාවකයක්, ශීතකාරයක් (සිසිලන කාරකයක්), ස්නේහකයක් හා මාධ්‍යයක් ලෙස භාවිත කරන අවස්ථා සඳහා උදාහරණ එක බැගින් ලියන්න. (ල. 02)

ii. බැටරි ඇසිඩ් ලෙස හඳුන්වන්නේ තනුක කරන ලද සාන්ද්‍ර සල්ෆියුරික් අම්ලය යි. මෙහිදී ප්‍රයෝජනවත් වන ජලයේ ගුණය කුමක්ද? (ල. 01)

iii. ග්ලූකෝස්, ඉටි, මැටි, ශල්‍ය ස්ප්‍රීතු, කහ කුඩු, පොල්තෙල් ජලයට දමා හොඳින් කැලතූ විට ජලයේ හොඳින් දියවන, මඳ වශයෙන් දියවන හා ජලයේ දියනොවන ද්‍රව්‍ය එක බැගින් ලියන්න. (ල. 03)

iv. ජලයේ දියවී ඇති දෑ වෙන් කර ගැනීම, ප්‍රයෝජනයට ගන්නා අවස්ථා දෙකකි, ලුණු සහ හකුරු නිපදවීම, ලුණු සහ හකුරු නිපදවා ගන්නේ කෙසේද? (ල. 02)

v. ජලයේ සිසිලනකාරක ගුණය පරීක්ෂා කිරීමට සැකසූ ඇටවුමක රූපසටහනක් පහත දැක්වේ.



මද වේලාවකින් A හා B බඳුන්වල ඇති උෂ්ණත්වමාන වල දක්නට ලැබෙන වෙනස්කම් වෙන් වෙන්ව ලියන්න. (ල. 02)

vi. ජීවත්වන මාධ්‍යයක් ලෙස ජලය යොදා ගන්නා ක්ෂිරපායි සතෙක් සහ උරගයෙක් නම් කරන්න. (ල. 02)

04) ද්‍රව්‍ය පිරිමැදීමෙන් ස්ථිති විද්‍යුත් අරෝපණ ඇති වේ.

i. ද්‍රව්‍ය පිරිමැදීමෙන් සැහැල්ලු ද්‍රව්‍ය ආකර්ශනය වන බව පෙන්වා දෙන ලද්දේ කවුරුන් විසින් ද? (ල. 01)

ii. ස්ථිති විද්‍යුත් ආරෝපණ වර්ග දෙකකි ඒවා නම් කරන්න. (ල. 02)

iii. සේද වලින් පිරිමැදීමෙන් වීදුරු දණ්ඩට ලැබෙන ආරෝපණය කුමක් ද? (ල. 01)

iv. සේද වලින් පිරිමදින ලද වීදුරු දණ්ඩක් හා ලොම් වලින් පිරිමදින ලද එබනයිට් දණ්ඩක් ළං කල විට එකිනෙක ආකර්ශනය වූයේ නම් එබනයිට් දණ්ඩේ ආරෝපණ වර්ගය කුමක් ද? (ල. 02)

v. ස්ථිති විද්‍යුත් ආරෝපණ ගබඩා කළ හැකි උපකරණය නම් කරන්න. (ල. 01)

vi. විද්‍යුත් ආරෝපණ මනිනු ලබන ඒකකය කුමක් ද? (ල. 01)

vii. වීදුරු දණ්ඩ හා එබනයිට් දණ්ඩ ලෝම වලින් පිරිමදින ලද්දේ නම්, ඒවා ළං කල විට කුමක් සිදු වේද? (ල. 02)

viii. ස්ථිති විද්‍යුත් ආරෝපණ ප්‍රයෝජනයට ගන්නා උපකරණ දෙකක් නම් කරන්න. (ල. 02)

05) නිවසේ භාවිත කරන බොහෝ ද්‍රව්‍ය මෙන්ම විද්‍යාගාරයේ භාවිත කරන රසායනික සංයෝගද ඒවායේ ගුණ අනුව අම්ල භස්ම හා උදාසීන ලෙස වර්ග කළ හැකිය.

(අ) i. ස්වභාවික පරිසරයේ ඇති ද්‍රව්‍ය යොදා ගෙන අම්ල, භස්ම හා උදාසීන ද්‍රව්‍ය වෙන් කර ගත හැකිය. එවැනි ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ල. 02)

ii. නිවසේ ඇති ආම්ලික ද්‍රව්‍ය 2 ක් ලියන්න. (ල. 02)

(ආ) විද්‍යාගාරයේ x, y හා z ලෙස නම් කර තිබූ දියර වර්ග තුනකට රතු හා නිල් ලිට්මස් කඩදාසි වෙන වෙනම එකතු කළ විට ලැබුණු නිරීක්ෂණ පහත දැක්වේ.

දියරය	නිල් ලිට්මස් දැමූවිට	රතු ලිට්මස් දැමූවිට
x	වර්ණ වෙනසක් නැත.	නිල් පැහැයට හැරුණි.
y	වර්ණ වෙනසක් නැත.	වර්ණ වෙනසක් නැත.
z	රතු පැහැයට හැරුණි.	වර්ණ වෙනසක් නැත.

i. භාෂ්මික ගුණ දරණ ද්‍රව්‍ය කුමක් ද? (ල. 01)

ii. උදාසීන ලක්ෂණ පෙන්වන ද්‍රව්‍ය කුමක් ද? (ල. 01)

iii. ඉහත දියර තුනට පිනොප්තලින් අවර්ණ ද්‍රාවණය එක් කළ විට රෝස පාටක් ඇතිවන්නේ කුමන දියරය සමඟ ප්‍රතික්‍රියා කිරීමෙන්ද? (ල. 01)

(ඇ) පහත සඳහන් ද්‍රාවණ තුනට වෙන වෙනම pH කඩදාසි කැබලි 3 ක් දමන ලදී.

ශල්‍ය ස්ප්‍රීතු ද්‍රාවණය, සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය, ජලීය හයිඩ්‍රෝක්ලෝරික් ද්‍රාවණය

ලැබෙන නිරීක්ෂණ ඇසුරින් පිළිතුරු ලියන්න.

i. pH කඩදාසියේ 1, 2, 3, 4, 5, 6 ට අදාළ වර්ණයක් ලබා දෙන ද්‍රාවණය කුමක්ද? (ල. 01)

ii. pH කඩදාසියේ 8, 9, 10, 11, 12, 13, 14 ට අදාළ වර්ණයක් ලබා දෙන ද්‍රාවණය කුමක් ද? (ල. 01)
iii. pH කඩදාසියේ 7ට අදාළ වර්ණය ලබා දෙන ද්‍රාවණය කුමක්ද? (ල. 01)
iv. පහත සඳහන් අවස්ථාවල දී භාවිත කරන රසායන ද්‍රව්‍ය මොනවා ද? ඉදිරියෙන් ලියා දක්වන්න. (ල. 02)

- මී මැස්සා දෂ්ට කළ විට ආලේප කරන ද්‍රව්‍ය :-
- ආමාශයේ ඇතිවන ගැස්ට්‍රයිටිස් හෙවත් බඩේ දැවිල්ලට විකා ගිලින ද්‍රව්‍ය :-

06) විදුලිය උත්පාදනය කළ හැකි ආකාර දෙකක් පහත දැක්වේ.



A



B

i. චුම්බකය දඟරය වෙත ළංකළ විට මැද බින්දු ගැල්වනෝමීටරයේ සිදුවන වෙනස කුමක්ද? (ල. 01)
ii. චුම්බකය දඟරයෙන් ඉවතට චලනය කරන විට මැද බින්දු ගැල්වනෝමීටරයේ සිදුවන වෙනස ලියන්න. (ල. 01)
iii. ඉහත A පරිපථයේ හටගන්නා විද්‍යුත් ධාරාව කුමන වර්ගයේ විද්‍යුත් ධාරාවක් ද? (ල. 02)
iv. B පරිපථයේ ස්විචය සංවෘත කළ විට LED වල නිරීක්ෂණය කුමක් ද? (ල. 01)
v. ඉහත (iv) හි ඔබ ලබා දුන් පිළිතුරට හේතුව කුමක් ද? (ල. 02)
vi. B පරිපථය තුළ ගලන්නේ කවර වර්ගයේ විදුලි ධාරාවක්ද? (ල. 02)
vii. ඉහත ආකාර දෙකට අමතරව විද්‍යුතය ජනනය කළ හැකි වෙනත් ආකාර දෙකක් ලියන්න. (ල. 02)
viii. A පරිපථයේ පවතින දඟරයේ පොටවල් ගණන වැඩි කළ විට ගැල්වනෝ මීටරයේ සූචකයේ උත්ක්‍රමණයෙහි සිදුවන වෙනස කුමක් ද? (ල. 01)

* * * * *

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education – Western Province

පළමු වාර ඇගයීම
First term Evaluation } 2018

ශ්‍රේණිය Grade	7	විෂයය Subject	විද්‍යාව	පත්‍රය Paper	I,II	කාලය Time	පැ. 02

නම Name } .... විභාග අංකය Index Number } ....

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1) මුදුන් මූල පද්ධතියක් සහිත ශාකය කුමක්ද?

i) අඹ ii) පොල් iii) උණ iv) කිතුල්

(2) නිදිකුම්බා ශාකයේ පවතින විශේෂ මුල් වර්ගය වන්නේ,

i) සංචිත මුල් වේ. ii) වායව මුල් වේ.
iii) මූල ගැටිති සහිත මුල් ය. iv) ආලග්න මුල් වේ.

(3) පුෂ්පයක පුමාංගයේ කෘත්‍ය කුමක්ද?

i) කෘමීන් ආකර්ෂණය කිරීම. ii) පරාග නිපදවීම.
iii) ඩිම්බ නිපදවීම iv) ළපටි පුෂ්ප ආරක්ෂා කිරීම

(4) පෘෂ්ඨවංශි සතුන් පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

i) අලියා, ගෙම්බා, ඉස්සා, මීයා ii) හූණා, ඉස්සා, කකුළුවා, නයා
iii) අලියා, නයා, ගෙම්බා, කැරපොත්තා iv) හූණා, නයා, මීයා, ගෙම්බා

(5) ද්‍රව්‍ය පිරිමැදීම නිසා එම ද්‍රව්‍ය මතුපිට හටගන්නා ස්ථිති විද්‍යුත් ආරෝපණ පළමුව පෙන්වා දුන් විද්‍යාඥයා කවුරුන්ද?

i) විලියම් සකර්බර්ග් ii) විලියම් ගිල්බර්ට්
iii) ඇල්බර්ට් අයින්ස්ටයින් iv) බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින්

(6) පහත දී ඇති ඒවායින් විද්‍යුත් ප්‍රභවයක් නොවන්නේ කුමක්ද?

i) සූර්ය කෝෂය ii) ඩයිනමෝව iii) වියළි කෝෂය iv) විදුලි මෝටරය

(7) පහත දී ඇති සංසිද්ධි අතුරින් ස්ථිති විද්‍යුතය හා සම්බන්ධ සංසිද්ධිය කුමක්ද?

i) වැස්ස ඇති වීම ii) අකුණු ඇතිවීම iii) වළාකුළු ඇති වීම iv) සුළඟ ඇති වීම

(8) ප්‍රත්‍යාවර්ත ධාරාවක ලක්ෂණය මින් කුමක්ද?

i) එකම දිශාවකට ධාරාව ගලා යයි ii) ධාරාව ගලන දිශාව වරින් වර වෙනස් වේ.
iii) ධාරාව (-) අග්‍රයේ සිට (+) අග්‍රය දෙසට ගලා යයි. iv) ධාරාව කඩින් කඩ ගලා යයි.

(9) විද්‍යුත් චුම්බක ප්‍රේරණය නම් මූලධර්මයට අනුව ධාරාව නිපදවන විද්‍යුත් උපාංගය පහත ඒවා අතරින් තෝරන්න.

i) වියළි කෝෂය ii) බල්බය iii) ධාරිත්‍රකය iv) ඩයිනමෝව

(10)  ඉහත රූපයේ පෙන්වා ඇති සංකේතය දක්වන උපාංගය කුමක්ද?

i) වියළි කෝෂය ii) බල්බය iii) ධාරිත්‍රකය iv) ඩයෝඩය

(11) ධාරාව මනිනු ලබන සම්මත ඒකකයේ සංකේතය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක්ද?

i) A ii) V iii) Ω iv) F

(12) පහත සඳහන් ශාක කාණ්ඩ අතරින් සමාන්තර නාරටි වින්‍යාසය සහිත පත්‍ර පමණක් දරණ ශාක කාණ්ඩය තෝරන්න.

i) වී, පුවක්, බඩඉරිඟු ii) අඹ, මිරිස්, මුං iii) පොල්, කපු, පුවක් iv) මෑ, බඩඉරිඟු, කොස්

(13) පහත සඳහන් කුමන ජලීය ද්‍රාවණයකට ෆිනොල්ප්තලීන් දැමූ විට රෝස පාට වේද?

i) තනුක සල්ෆියුරික් අම්ලය ii) සෝඩියම් හයිඩ්රොක්සයිඩ් ද්‍රාවණය

iii) තනුක නයිට්‍රික් අම්ලය iv) ලුණු ද්‍රාවණය

(14) නිල් ලිට්මස් රතු පැහැයට හරවනු ලබන්නේ,

i) දෙහි යුෂයි ii) සබන් දියරය යි iii) ලුණු ද්‍රාවණය යි iv) පිරිසිදු ජලය යි

(15) භෂ්ම පමණක් අඩංගු වන පිළිතුර තෝරන්න.

i) දෙහි, සබන්, ලුණු iii) හුණු දියර, සබන්, සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්

ii) විනාකිරි, දෙහි, සියඹලා iv) ලුණු ද්‍රාවණය, හුනු දියර, සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්

(16) උක් ශාකයේ යුෂයේ හි දියවී ඇති සීනි වර්ගය වන්නේ

ii) ග්ලූකෝස්ය ii) මෝල්ටෝස්ය iii) ලැක්ටෝස්ය iv) සුක්රෝස්ය

(17) සන්නායකයක් සමඟ චුම්භක බල රේඛා ගැටීමේ දී සන්නායක තුල විද්‍යුතය උත්පාදනය වීම හඳුන්වන්නේ,

i) විද්‍යුත් චුම්භක ප්‍රේරණය නමිනි ii) ස්ථිති විද්‍යුතය නමිනි

iii) ධාරා විද්‍යුතය නමිනි iv) විද්‍යුත් ගාමක බලය නමිනි

(18) මුහුදු ජලයේ වැඩිපුරම දියවී ඇති ලවණය වන්නේ,

i) සෝඩියම් ක්ලෝරයිඩ් ii) කැල්සියම් ක්ලෝරයිඩ්

iii) මැග්නීසියම් සල්ෆේට්ය iv) කැල්සියම් සල්ෆේට්ය

(19) අම්ල හමුවේ මෙතිල් ඔරේන්ජ් වල වර්ණය

i) අවර්ණය ii) කහ පැහැතිය iii) රතු පැහැතිය iv) සුදු පැහැතිය

(20) ද්වි බීජ පත්‍ර ශාකවල දක්නට ලැබෙන ලක්ෂණය කුමක්ද?

i) තන්තු මුල පද්ධතියක් තිබීම. iii) සමාන්තර නාරටි වින්‍යාසයක් තිබීම.

ii) කඳ අතු බෙදී නොතිබීම. iv) පුෂ්ප කොටස් පහක් හෝ පහේ ගුණාකාරයක් පැවතීම.

II කොටස

01 වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

(1) පුෂ්පයක දික් කඩක දළ සටහනක් පහත දැක්වේ.



(i) A සිට D දක්වා කොටස් නම් කරන්න. (2)

(ii) A හා C කොටස් මගින් ඉටු කරන කාර්යයන් පිළිවෙළින් සඳහන් කරන්න. (2)

(iii) ජායාංගයේ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න. (3)

(iv) පහත සඳහන් ඵල හා බීජ ව්‍යාප්ත වන ක්‍රම සඳහන් කරන්න. (2)

(v) පහත සඳහන් A හා B රූප සටහන් අතරින් ඒකබීජපත්‍රි බීජයක ප්‍රරෝහනය පෙන්වන්නේ කුමන රූප සටහන මගින්ද? (1)



(vi) මෙහි X ලෙස දක්වා ඇති ව්‍යුහය කුමක්ද? (1)

(vii) පොල්, සැල්වීනියා, මඩු, සමන්පිච්ච යන ශාක අතරින් සපුෂ්ප ශාක තෝරා ලියන්න. (2)

(viii) පහත මුල් වර්ග දැකිය හැකි ශාකය බැගින් සඳහන් කරන්න. (3)

a) කරු මුල් b). ආලග්න මුල් c). වායුධර මුල්

(2) A) සත්ත්වයන්ට ආරක්ෂාව සඳහා වර්ණය වැදගත් වේ. එමෙන්ම සංචරණය සඳහා හැඩය වැදගත් වේ. මේ පිළිබඳව සිසුන් කණ්ඩායමක් සිදුකළ ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ.

(i) ඉහත ක්‍රියාකාරකමේ දී ලැබුණු නිරීක්ෂණය කුමක්ද? (1)

(ii) එම නිරීක්ෂණ අනුව ලබා ගන්නා නිගමනය කුමක්ද? (1)

(iii) පක්ෂීන්ට ශරීර හැඩය සංචරණයේ දී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (1)

B) පහත ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් X ලකුණ ද වරහන් තුළ යොදන්න.

(i) අක්කපාන පත්‍ර වර්ධක ප්‍රචාරණය සිදු කරයි. ( )

(ii) දිවියාගේ ශරීරයේ පුල්ලි පිහිටීම නිසා වෙනත් සතුන්ට පහසුවෙන් හඳුනාගත නොහැක.( )

(iii) පාට කළ ටූත්පික් භාවිතා කර සිදුකළ ක්‍රියාකාරකමේ දී බොරළු පොළව මත විසුරුවා හරින ලද අවස්ථාවේ පළමුවෙන්ම ඇහිද අවසන් කළේ දුඹුරු පැහැති ටූත් පික්ය. ( )

(iv) ගොළුබෙල්ලා, ඉස්සා යන සතුන් අපෘෂ්ඨවංශීන් වේ. ( )

(v) තණකොළපෙත්තා වියළි තණකොළ අතර සිටින විට පහසුවෙන් හඳුනාගත නොහැක. ( )

(vi) දෙබෙදුම් සුවියක් භාවිතයෙන් ජීවීන් වර්ග කිරීමේ විශාල සතුන්, කුඩා සතුන් යන්න යොදා ගත හැකිය. ( )

(vii) ඉගුරු, ලූනු වැනි ශාක වල භූගත කඳන් ඇත. ( )

(viii) පැපොල් ශාක පත්‍ර සංයුක්ත පත්‍ර වේ. ( )

(8x1)

(3) ජීවීන් වර්ගීකරණය සඳහා දෙබෙදුම් සුවි භාවිතා කරනු ලැබේ.

(i) දෙබෙදුම් සුවියක ප්‍රධාන ලක්ෂණයක් ලියන්න. (1)

(ii) පහත දෙබෙදුම් සුවිය සම්පූර්ණ කරන්න. (9)

ගිරවා , බලයා , ලේනා , හූනා , ගැරඬියා , ගොළුබෙල්ලා

පාද ඇත
ගිරවා , ලේනා , හූනා

a…………………………..
බලයා , ගැරඬියා , ගොළුබෙල්ලා

b……………………
ලේනා , හූනා

පාද 4 ක් නැති
c…………………..

වරල් ඇත
d………………

e……………………..
ගැරඬියා , ගොළුබෙල්ලා

කන් පෙති ඇති
f…………………..

කන් පෙති නැති
g…………………..

h………………..
ගොළුබෙල්ලා

බාහිර කවච නැත
i……………………….

(iii) පෘෂ්ඨ වංශීන් හා අපෘෂ්ඨ වංශීන් අතර ප්‍රධාන වෙනස කුමක්ද? (1)

(4) ශිෂ්‍ය කණ්ඩායමක් ජලයේ ගුණයක් පරීක්ෂා කිරීම සඳහා පහත රූපයේ දැක්වෙන පරිදි ඇටවුමක් සකස් කර විද්‍යාගාරය තුළ තබන ලදී.



(i) ඉහත ක්‍රියාකාරකම මගින් පරීක්ෂා කිරීමට අපේක්ෂා කරනුයේ ජලයේ කුමන ගුණාංගයද? (1)

(ii) A උපකරණය නම් කරන්න. (1)

(iii) මෙහිදී A උපකරණය භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණක් ලියන්න. (1)

(iv) ඉහත සඳහන් ගුණය ප්‍රායෝගිකව යොදාගන්නා අවස්ථාවක් ලියන්න. (1)

(v) ඉහත සඳහන් ගුණයට අමතරව ජලයේ වෙනත් ගුණයක් ලියන්න. (1)

(vi) ජලයේ හොඳින් දිය වන ද්‍රව්‍යයක් හා දිය නොවන ද්‍රව්‍යයක් ලියන්න. (2)

(vii) ඩයිනමෝවක විදුලිය උත්පාදනය වන ආකාරය ආදර්ශනය කිරීමට අදාළ ක්‍රියාකාරකමට අදාළ අවස්ථා දෙකක් පහත දක්වා ඇත.





එක් එක් අවස්ථාවට අදාළ නිරීක්ෂණ ලියන්න. (2)

I අවස්ථාවට අදාළ නිරීක්ෂණය ....

II අවස්ථාවට අදාළ නිරීක්ෂණය ....

(viii) මෙහිදී කම්බි දඟරය තුළ විදුලිය උත්පාදනය වීමේ දී ක්‍රියාත්මක වන මූලධර්මය ලියන්න. (2)

(5) (i) පහත සඳහන් ද්‍රව්‍ය ආම්ලික, භාෂ්මික, උදාසීන ද්‍රව්‍ය ලෙස වෙන් කරන්න. (3)

හුනු දියර , විනාකිරි , ලුණු ද්‍රාවණය , පිරිසිදු ජලය , දෙහි යුෂ , අළු දිය කළ ජලය

ආම්ලික ද්‍රව්‍ය	භාෂ්මික ද්‍රව්‍ය	උදාසීන ද්‍රව්‍ය

(ii) ඉහත සඳහන් ලෙස ද්‍රව්‍ය වෙන් කිරීමට විද්‍යාගාරයේ දී යොදා ගත හැකි දර්ශකයක් ලියන්න. (1)

(iii) විද්‍යාගාරයේ භාවිතයට ගන්නා අම්ලයක් නම් කරන්න. (1)

(iv) විද්‍යාගාරයේ දී භාවිතයට ගන්නා pH කඩදාසි වල වර්ණය ලියන්න. (1)

(v) සුදුසු වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න. (4)

නිල් .... රතු පැහැයට හරවන ද්‍රව්‍ය .... ලෙස හඳුන්වයි. රතු .... නිල් පැහැයට හරවන ද්‍රව්‍ය .... ලෙස හඳුන්වයි.

(vi) විද්‍යාගාරයේ දී භාවිතයට ගන්නා භාෂ්මික ද්‍රව්‍යයක් නම් කරන්න. (1)

(06).



A B C

ඉහත පෙන්වා ඇත්තේ ඔබ විද්‍යාගාරයේ දී සිදු කරන ලද ක්‍රියාකාරකමක් සඳහා සකස් කරන ලද ඇටවුම් 3 කි. ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) වගුවේ හිස්තැනට අදාළ අක්ෂරය ලියන්න. (3)

සෑමවිටම එක් LED යක් පමණක් දැල්වේ.	LED දෙකම දැල් වේ.	LED 2 මාරුවෙන් මාරුවට දැල්වේ.

(ii) ඉහත ඇටවුම් 3 න් එක් ඇටවුමක පමණක් LED 2 ම මාරුවෙන් මාරුවට දැල්වීමට හේතුව කුමක්ද? (1)

(iii) සරල ධාරාව යනු කුමක්ද? (2)

(iv) බැටරියක් ලෙස හැඳින්වෙන්නේ කුමක්ද? (1)

(v) ඔබ විසින් විද්‍යාගාරයේ දී සකස් කරන ලද ඇටවුමක් ඉහත දැක්වේ. ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.



a. X හා Y ලෝහ තහඩු නම් කරන්න. (2)

b. එම තහඩු 2 ගිල්වා ඇති Z නැමැති ද්‍රාවණය කුමක්ද? (1)

c. ඉහත ඇටවුම හඳුන්වන නම කුමක්ද? (1)

(7)

A B

ඉහත දක්වා ඇත්තේ ඔබ විද්‍යාගාරයේ දී සිදු කරන ලද ක්‍රියාකාරකමක රූප සටහනකි. ඒ අසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) සේද වලින් පිරිමදිනු ලැබූ වීදුරු දඬු වලට ලැබුණු ස්ථිති විද්‍යුත් ආරෝපණ වර්ගය කුමක්ද? (2)

(ii) ලෝම වලින් පිරිමදිනු ලැබූ එබනයිට් දණ්ඩට ලැබුණු ආරෝපණය කුමක්ද? (1)

(iii) දඬු අතර ආකර්ෂණයක් ඇතිවන්නේ ඉහත A හා B අවස්ථා දෙකෙන් කුමන අවස්ථාවේ ද? (1)

(iv) දඬු අතර විකර්ෂණයක් ඇතිවන්නේ ඉහත A හා B අවස්ථා දෙකෙන් කුමන අවස්ථාවේ ද? (1)

(v) ඉහත අවස්ථා දෙකෙහි දි එලෙස දඬු අතර ආකර්ෂණ හා විකර්ෂණ ඇතිවීමට හේතුව කුමක්ද? (2)

(vi) ධාරිත්‍රකයක් යනු කුමක්ද? (1)

(vii) ෆැරඩ් (F) හෝ මයික්‍රෝ ෆැරඩ් (μF) ඒකක වලින් මනිනු ලබන්නේ කුමක්ද? (2)

ශාන්ත ජෝන් විදුහල - නුගේගොඩ

දෙවන වාර පරීක්ෂණය

පළමුවාර පරීක්ෂණය -7 ශ්‍රේණිය විද්‍යාව

කාලය - පැය 2

I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. සතුන් මඟින් බීජ ව්‍යාප්තියට අනුවර්තනය වූ ශාකය කුමක්ද?

1.හොර 2. කඳුරු

3. ගම්මාලු 4. තුත්තිරි

2. සංයුක්ත පත්‍ර දරණ ශාකය කුමක්ද?

1. පැපොල් 2. මඤ්ඤොක්කා

3. සිටඹලා 4. පේර

3. මුල් මඟින් වර්ධක ප්‍රචාරණය සිදු කරන ශාකයකි.

1. ඉඟුරු 2. දෙල්

3. පුවක් 4.ඉරිඟු

4. සරල කෝශකයක ධන අග්‍රයට යොදා ඇත්තේ,

1. කොපර් තහඩුවකි 2. කාබන් කුරකි

3. සින්ක් තහඩුවකි 4. කාබන් කුඩු මිශ්‍රනයකි

5. ප්‍රත්‍යාවර්තක ධාරාවක් ජනනය වන්නේ පහත කුමන උපකරණයෙන්ද?

1. ඩයිනමෝවෙන් 2. කාර් බැටරියෙන්

3. බොත්තම් බැටරියෙන් 4. වියළි කෝෂයෙන්

6. ධාරිත්‍රකය සඳහා යොදන පරිපථ සංකේතය පහත කවරක්ද?

1. 

2. 

3.



7. රූපයේ දැක්වෙන පරිදි එල්ලා ඇති A නම් දණ්ඩ අසළට B නම් තවත් දණ්ඩක් නම් කළ විට A දණ්ඩ ආකර්ෂණය වන බව දක්නට ලැබුණි. මේ සම්බන්ධයෙන් සත්‍යය වන්නේ පහත කුමන වගන්තියද?

1. A දණ්ඩ ධන ලෙස ආරෝපිත වන අතර B හි ආරෝපනයක් නැත

2. B දණ්ඩ ධන ලෙස ආරෝපිත වන අතර A හි ආරෝපනයක් නැත

3. A දණ්ඩ ධන හා B දණ්ඩ ඍණ ලෙස ආරෝපිත වේ.

4. A හා B දඩු ධන ලෙස ආරෝපිත වේ.

8. සරල කෝෂයක් තුළින් ධාරාවක් ගමන් කිරීමේ දී ගැල්වනෝ මීටරයේ කටුව උත්ක්‍රමණය වේ. මේ අවස්ථාවේ දී වායු බුබුළු වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ කුමන කොටසේද?

1. ද්‍රාවනය පුරා

2. තහඩු දෙකම අසල

3. කොපර් තහඩුව අසල

4. සින්ක් තහඩුව අසල

9. පොලිතින් ලෙසින් පිරිමදින ලද බීම බටයක් ඩ්‍රෝවින් පින් එකක් ආධාරයෙන් වීදුරුව මත තබා ඇත. එහි ආකාර්ෂණයක් දැකිය හැකි වන්නේ කුමන ද්‍රව්‍ය නම් කිරීමෙන්ද?

1. බීම බටය පිරි මැදි පොලිතීන් ලං කිරීමේන

2. පොලිතීන් වලින් පිරිමදින ලද තවත් බීම බටයක් ලං කිරීමෙන්

3. පිරිමැදීමකින් තොරව බීම බටයක් ලං කිරීමේ දී

4. තඹ ලෝහ කැබැල්ලක් ලං කිරීමේ දී

10. ද්‍රාවකවක් ලෙස වැඩි වශයෙන් භාවිතා කරන්නේ කුමන ද්‍රව්‍යයද?

1. ජලය

2. මධ්‍යසාර

3. තිනර්

4. ඇසිටික් අම්ලය

11. ශාකවලට ඛණිජ ලවන උරා ගැනීම සිදු වන්නේ ජලය සතු කුමන කාර්යයක් ඉටු කරන නිසාද?

1. මාධ්‍යයක් ලෙස
2. ද්‍රාවකයක් ලෙස
3. සිසිලන කාරකයක් ලෙස
4. පරිවාරකයක් ලෙස

12. විද්‍යාගාරයේ දී විවිධ ද්‍රාවණ වලට විවිධ දර්ශක දමා පරීක්ෂා කර බැලීමක් සිදු විය. එහිදී නිනෝප්තලීන් නම් දර්ශකය හමු වේ. රෝස පැහැයක් ලබා දෙනුයේ,

1. විනාකිරි
2. හයිඩ්‍රක්ලෝරික් අම්ල
3. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් අම්ලය
4. සල්ෆියුරික් අම්ලය

13) මීතයිල් ඔරේන්ජ් එක් කළ විට රතු පැහැයෙන් ලබා දෙන්නේ පහත කවර ද්‍රාවනයක්ද?

1) හුණු දියර
2) සීනි ද්‍රාවනය
3) ලුණු ද්‍රාවණය
4) විනාකිරි

14) ස්වභාවික පර්සරයෙන් සපයා ගත හැකි දර්ශකයකි.

1) නිල් කටරොළු මල් යුෂ
2) ලිට්මස් කඩදාසි
3) දෙහි යුෂ
4) අළු දියර

15) පෘෂ්ඨවංශියෙක් හා අපෘෂ්ඨවංශියෙක් පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) මිනිසා, කටුස්සා
2) කටුස්සා, කුඩැල්ලා
3) ගොළුබෙල්ලා, ලේනා
3) කුඩැල්ලා, ඉස්සා

16) චලනය මඟින් කරකැවීම මඟින් විදුලිය නිපදවන උපාංගයකි.

1) වියළි කෝෂය
2) සූර්ය කෝෂය
3) ඩයිනමෝව
4) ඊයම් අම්ල ඇකියුම්ලේටරය

17)



මෙහි දැක්වෙන පරිදි පරිවෘත තඹ කම්බි දඟරයක් තුළ චුම්භකය චලනය කරන විට G හි කටුවේ උත්ක්‍රමයක් සිදුවිය. G හි කටුවේ සිදුවන උත්ක්‍රමයේ වැඩිවීමක් සිදු නොවිය හැක්කේ පහත කුමන අවස්ථාවේද?

1) දඟරයේ පොට ගණන වැඩි කිරීමේදී
2) චලනය සඳහා වඩා ප්‍රබල චුම්භකයක් යෙදාගැනීමේදී
3) චුම්භකයේ චලන වේගය වැඩි කිරීමේදී
4) චුම්භකයේ අග්‍ර මාරු කිරීමේදී

18) ජීවීන්ගේ ශරීර වර්ණය පරිසරයේ වර්ණය සමඟ ගැළපීම හඳුන්වන්නේ,

1) වේශාන්තරය ලෙස 2) රූපාන්තරණය ලෙස

3) අනුවර්තනය ලෙස 4) පරිවර්තනය ලෙස

3.A i. පහත ලැයිස්තුවේ දැක්වෙන සතුන් අතරින් පෘෂ්ටවංශීන් දෙදෙනෙක් සහ අපෘෂ්ටවංශීන් දෙදෙනෙක් නම් කරන්න. ල - 2

(තලගොයා, ගෝනුස්සා, මඳුරුවා, වවුලා, මී මැස්සා, නයා, පසැඟිල්ලා)

ii. මිනිසා අයත් වන්නේ කුමන කාණ්ඩයටද? ල - 2

B. i. අනුවර්තනය යනු කුමක්ද? ල - 1

ii. මෙම අනුවර්තන ඔවුන්ගේ විවිධ අවශ්‍යතා සඳහා සපුරා ගැනීමට උදව් වේ. එම අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න. ල - 2

iii. පහත සඳහන් ජීවීන් පරිසරයට දක්වන අනුවර්ථනය බැගින් ලියන්න. ල - 2

1. දළඹුවා

2. තණකොළ පෙත්තා

iv. පරාගනය සඳහා කෘමීන් ආකර්ෂණය කර ගැනීමට පුෂ්ප දක්වන අනුවර්තන දෙකක් ලියන්න. ල - 2

v. වේශාන්තරණය නිසා සතුන්ට සැලසී ඇති වාසියක් සඳහන් කරන්න. ල - 1

4. A. එදිනෙදා ජීවිතයේදි ජලයේ ගුණ විවිධ ආකාරයෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ. එසේම ජීවී දේග තුළ සිදුවන ජීව ක්‍රියා සඳහා ජලය මාධ්‍යයක් වේ.

i. ජලය මාධ්‍යයක් ලෙස භාවිතා වන ජීව ක්‍රියාවලියක් නම් කරන්න. ල - 1

ii. ජලයේ ද්‍රාවක ගුණය හා සිසිලනකාරක ගුණය එදිනෙදා භාවිතයට ගන්නා අවස්ථාවක් බැගින් ලියන්න.

ද්‍රාවක ගුණය - ....

සිසිල්කාරක ගුණය - ....

iii. මුහුදු ජලයේ වැඩිපුරම දිය වී ඇති ලවණය නම් කරන්න ල - 1

iv. ජලය ජීවයේ මාධ්‍යක් කර ගත් සතුන් දෙදෙනෙකු නම් කරන්න. ල - 2

B. ජලයේ ගුණාංගයක් පරීක්‍ෂා කිරීමට විද්‍යාලාරයේ දී සැළසුම් කළ පරීක්‍ෂණ ඇටවුමක රූපසටහනක් පහත දැක්වේ.



i. මුල් අවස්ථාවේ දී උෂ්ණත්වමාන දෙකේ පාඨාංක පිළිබඳ කුමක් කිව හැකිද? ල - 1

ii. දෙවන අවස්ථාවේ දී b බීකරයේ දී තිබූ වියළි පුළුන් ජලයෙන් තෙත් කර උෂ්ණත්වමාන පාඨාංක ගන්නා ලදී. එම පාඨාංක අගය අඩු වේද? වැඩිවේද? ල - 1

iii. මෙහිදී පරීක්‍ෂා කරන ලද්දේ ජලයේ කුමන සුවිශේෂ ගුණය ද? ල - 1

iv. ජල සංරක්‍ෂණය සඳහා ශිෂ්‍යයෙකු ලෙස ඔබෙන් ඉටු විය යුතු යුතුකම් දෙකක් ලියන්න. ල - 2

5. එදිනෙදා කටයුතුවලදී මෙන්ම විද්‍යාගාර පරීක්‍ෂණ වලදී අම්ල භෂ්ම හා උදාසීන ද්‍රව්‍ය සුලභව භාවිතා කරයි. ඒ අනුව පහත දැක්වෙන් වගුව සම්පූර්ණ කරන්න.

	අම්ල	භෂ්ම	උදාසීන ද්‍රව්‍ය
නිවසේ දී			
විද්‍යාගාරයේ දී			

ල - 2

i. ප්‍රභල අම්ල සඳහා PH කඩදාසි මඟින් ලබා දෙන වර්ණය කුමක්ද? ල - 1

ii. දර්ශකයක් යනු කුමක්ද? ල - 1

iii. නිවසේදි භාවිතා කරන දර්ශක දෙකක් සහ විද්‍යාගාරයේ දි භාවිතා කරන දර්ශක දෙකක් බැගින් නම් කරන්න

06) 7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් කණ්ඩායමක් විසින් සිදු කරන ලද පරීක්ෂණයක රූප සටහන පහත දැක්වේ.



I. බීම බටය ආරෝපණය කර ගැනීමට කුමක් කළ යුතුද? (ල. 01)

II. බීම බටයේ ඇති ආරෝපණ හඳුන්වනු ලබනුයේ කෙසේද? (ල. 01)

III. එලෙස හටගනු ලබන ආරෝපණ වර්ග දෙක කම් කරන්න. (ල. 01)

IV. ආරෝපණය කළ බීම බටයට තවත් එවැනීම ආරොපණය කළ බීම බටයක් ළං කළ විට ලැබෙන නිරීක්ෂණය කුමක්ද? එම නිරීක්ෂණයට හේතුව කුමක්ද? (ල. 03)

V. ඉහත ii හි සඳහන් ආරෝපණ ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් සඳහන් කරන්න (ල. 02)

VI. මෙම ආරෝපණ ගබඩා කළ හැකි උපකරණයේ නම කුමක්ද? (ල. 01)

VII. ආරෝපණ හඳුනා ගැනීමට විද්‍යාගාරයේදී භාවිතා කළ හැකි උපකරණය කුමක්ද? (ල. 01)

VIII. අකුණු හටගැනීම පිළිබඳ මුලින්ම පර්යේෂණ කළ විද්‍යාඥයා කවුද? (ල. 01)

පළමු වාර පරීක්ෂණය-2020.

7 ශ්‍රේණිය - විද්‍යාව I

01.අපුෂ්ප ශාක පමණක් අයත් පිළිතුර තෝරන්න.

I.කොස්,කරපිංචා,කිතුල් II.අඹ,කජු,පේර III.මඬු,බේදුරු,සැල්වීනියා IV. වද,මීවණ,සයිප්‍රස්

02.පුෂ්පයක දික්කඩක රූප සටහනක් පහත දැක්වේ.a,b,c,d අක්ෂර වලින් දක්වා ඇති ව්‍යුහ කුමක්ද?



I.කලංකය,රේණු,දළපත්‍ර,ඩිම්බකෝෂ

II.මණිපත්‍ර, රේණු,දළපත්‍ර,කලංකය

III. කලංකය,පරාගධානි, ඩිම්බකෝෂ, දළපත්‍ර

IV. ඩිම්බකෝෂ, කලංකය, දළපත්‍ර,මණිපත්‍ර

03.චුම්භක ප්‍රේරණය මගින් විදුලි ජනනය වන්නේ,

I.විදුලි මෝටරයෙනි II.ඩයිනමෝව III.විදුලි බල්බයෙනි IV.විදුලි උඳුන

04.ජලයේ දියවී ඇති සංයෝග වෙන් කරන අවස්ථාව කුමක්ද?

I. උක් යුෂයෙන් සුක්‍රෝස් ලබාගැනීම II.මුහුදු ජලයෙන් ලුණු ලබාගැනීම

III.මීරා වලින් හකුරු ලබාගැනීම IV.ඉහත සඳහන් සියල්ලම

05.ප්‍රභාසංශ්ලේෂණය ඉටුකරන ශාක කඳක් නොවන්නේ කුමක්ද?

I.නවහන්දි II.බඩඉරිඟු III.හතාවාරිය IV.පතොක්

06.මූලගැටිති සහිත මුල් වලින් ශාකයට ඇති ප්‍රයෝජනය කුමක්ද?

I. වායු හුවමාරුව II.බැක්ටීරියා මඟින් පස සරු කිරීම

III.වාතයේ ඇති ජල වාෂ්ප අවශෝෂණය කිරීම IV.ආධාරකයට සවිවීම සඳහා

07.පහත සංකේත අතරින් ධාරිත්‍රකයේ සංකේතය කුමක්ද?

I.  II.  III.  IV.

08.සේද රෙදි වලින් පිරිමදින වීදුරු දණ්ඩක් සමබර ලෙස එල්ලා ඇත.එම වීදුරු දණ්ඩ විකර්ශනය සිදුවන්නේ පහත කුමන ක්‍රියාවක් මගින්ද?



I.පිරිමැදීමට භාවිතා කළ සේද රෙදි කැබැල්ල වෙත ගෙන ඒම

II. සේද රෙදි කැබැල්ලකින් පිරිමදින ලද වීදුරු දණ්ඩක් එය වෙත ගෙන ඒම

III.පිරි නොමදින ලද වීදුරු දණ්ඩක් එය වෙත ගෙන ඒම

IV.යකඩ දණ්ඩක් එය වෙත ගෙන ඒම

09.භූගත කඳක් දැකිය හැකි කුමන ශාකයේද?

I.ඉරිඟු II.බතල III.ඉඟුරු IV.කැරට්

10.ධාරාව ගලන දිශාව මැනීමට සුදුසුම උපකරණය කුමක්ද?

I.ඇමීටරය II.මල්ටි මීටරය III.වෝල්ට් මීටරය IV.මැද බින්දු ඇමීටරය

11.සරල කෝෂයේ බල්බය දැල්වෙන විට වායු බුබුල් වැඩි වශයෙන් ඇති වන්නේ කුමන කොටස තුළද?



I.ධන තහඩුව අසල

II.ඍණ තහඩුව අසල

III. ද්‍රාවණය පුරා

IV. තහඩු දෙකම අසල

12.දර්ශකයක් ලෙස භාවිතා කළ හැකි ද්‍රාවණය තෝරන්න.

I.දෙහියුෂ II.ෂැම්පු ද්‍රාවණය III.නිල්කටරොළු තැම්බූ ජලය IV.සෝඩා වතුර

13.පහත දක්වා ඇති වස්තුවලින් අනාකූල හැඩයක් ඇති වස්තුව කුමක්ද?

I.  II. III.  IV. 

14.නිවසේ දැකිය හැකි අම්ල,භස්ම හා උදාසීන ද්‍රව්‍ය පිළිවලින් අඩංගු වනුයේ කුමන කාණ්ඩයේද?

I. සබන් දියර,විනාකිරි,ජලය II. ජලය,විනාකිරි, සබන් දියර

III. ජලය,දෙහියුෂ,සබන් දියර IV. විනාකිරි, සබන් දියර ,ජලය

15.අචලතාපී ජීවින්ගේ ශරීර උෂ්ණත්වය පිළිබඳ නිවැරදි වගන්තිය කුමක්ද?

I.පරිසර උෂ්ණත්වය වැඩිවන විට ශරීර උෂ්ණත්වය වැඩි වේ.

II. පරිසර උෂ්ණත්වය වෙනස් වුවද ශරීර උෂ්ණත්වය වෙනස් නොවේ.

III.පරිසර උෂ්ණත්වය අඩු වන විට ශරීර උෂ්ණත්වය වැඩි වේ.

IV.පරිසර උෂ්ණත්වය වැඩිවන විට ශරීර උෂ්ණත්වය අඩු වේ.

16.P^{H} අංක පරාසය 1 සිට 6 දක්වා පවතින ද්‍රව්‍ය වේ.

I.ආප්ප සෝඩා II.දෙහි යුෂ III.ආස්‍රැත ජලය IV.ලුණු ද්‍රාවණය

17.ද්‍රව්‍ය පිරිමැදීමේදී ස්ථිති විද්‍යුත් ආරෝපණ ඇති වන බව පෙන්වා දෙන ලද්දේ,

I.චාල්ස් ඩාවින් II.විලියම් හාවි III.විලියම් ගිල්බර්ට් IV.බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින්

18.රූපයේ දැක්වෙන්නේ කාලයක් සමඟ ධාරාව වෙනස් වන ආකාරය පෙන්වන ප්‍රස්ථාරයකි.මෙහි සත්‍ය ප්‍රකාශය තෝරන්න.



I.ධාරාව ගලන දිශාව වෙනස් වේ.
II.ධාරාව එකම දිශාවට ගලයි.
III.මෙවැනි ධාරාවක් වියළි කෝෂයේ ඇත
IV.කිසිවක් කිව නොහැක

19.මිනිස් සිරුරට ජලයෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද?
I.සිරුරේ නිපදවන බහිස්‍රාවී ද්‍රව්‍ය පරිවහනය II.ශ්වසනයට ජලය අත්‍යාවශ්‍ය වේ. III.ස්නායු පද්ධතියට ජලය මඟින් ආරක්ෂා වේ IV. සංවේදනය ලබාගැනීමට ජලය ආධාර වේ

20.පෘෂ්ඨවංශීන් පමණක් ඇතුළත් වන පිළිතුර තෝරන්න.
I.මුහුදු ලිහිණියා,සමනලයා,මාළුවා II.කැස්බෑවා,ඉබ්බා,ගෙම්බා III.ගෙම්බා,ගොළු බෙල්ලා,පසගිල්ලා IV.ඉබ්බා, මුහුදු ලිහිණියා,ගොළු බෙල්ලා

21.විලෝපිකයින්ගෙන් ආරක්ෂා වීම සඳහා වර්ණය උපයෝගි කරගත් සත්ත්වයකු නොවන්නේ?
I.දිවියා II.කටුස්සා III.හාවා IV.පේරකොළයා

22.පහත දැක්වෙන අවස්ථා අතරින් ජලයේ ද්‍රාවක ගුණය භාවිතා නොවන අවස්ථාව කුමක්ද?
I.රසායනාගාරයේදී ද්‍රාවණ පිළියෙල කිරීමට II.සෝදන කුඩු වර්ග යොදා රෙදි සේදීම
III.සිසිල් බව නිපදවා ගැනීමට IV.ජල ගිනි නිවනය මඟින් ගින්නක් නිවා දැමීම

23.උදාසීන ද්‍රව්‍ය පමණක් අඩංගු වන්නේ,
I.ජලය,දෙහියුෂ,හුණුදියර II.ජලය,ලුණු ද්‍රාවණය,භූමිතෙල්

III. භූමිතෙල්,විනාකිරි,අළු ද්‍රාවණ IV.සබන් ද්‍රාවණ,කුණු ද්‍රාවණ,දෙහි යුෂ

24.දෙබඳුම් සුචියක ලක්ෂණයක් නොවන්නේ කුමක්ද?

I.පහසුවෙන් වෙන්කළ හැකි ලක්ෂණයක් වීම
II.වරකට එක් ලක්ෂණයක් ඇති,නැති ආකාරයට වෙන් කිරීම
III.අවසානයේදී එක් ජීවියකු/ද්‍රව්‍යක් පමණක් වෙන් කිරීම
IV.අභ්‍යන්තර ලක්ෂණ අනුව වෙන් කිරීම

25.ජලයේ සිසිලනකාරක ගුණය උපයෝගී කරගන්නා අවස්ථාවක් නොවන්නේ කුමක්ද?
I.මිනිසා නෑම මඟින් දහඩිය නිවා ගැනීම
II.වාහනවල රේඩියටරය සිසිල් කරයි
III.උණුසුම් ද්‍රව්‍ය ජලය දමා සිසිල් කිරීම
IV.ඉහත සඳහන් සියල්ලම

පිළිතුරු

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පළමු වාර පරීක්ෂණය - 2019
7 ශ්‍රේණිය - විද්‍යාව
පිළිතුරු පත්‍රය

I කොටස

ප්‍රශ්. අංක	පිළිතුර	ප්‍රශ්. අංක	පිළිතුර	ප්‍රශ්. අංක	පිළිතුර	ප්‍රශ්. අංක	පිළිතුර	ප්‍රශ්. අංක	පිළිතුර
1	2	6	2	11	1	16	3	21	2
2	4	7	3	12	4	17	1	22	1
3	4	8	2	13	2	18	4	23	3
4	3	9	2	14	3	19	3	24	1
5	1	10	1	15	3	20	4	25	3

II කොටස

01)	(අ)	i.		නිදිකුම්බා	01
		ii.		මඬු හෝ පොල්	01
		iii.		නිදිකුම්බා හෝ පොල්	01
		iv.		මඬු හෝ බේදුරු	01
		v.		නිදිකුඹ්බා	01
		vi.		කොට්ටම්බා	01
		vii.		පොල්	01
		viii.		අගුණ වැල්	01
				බීජය වටා කෙඳි තිබීම.	01
	(ආ)	i.		පරාග නිපදවීම	01
		ii.		x - පරාගධානිය y - සූත්‍රිකාව	02
					12
02)	(අ)	i.		A - පිහාටු ඇති B - පිහාටු නැති වැනි නිවැරදි පිළිතුරට	02
				C - මුහුදු බෙල්ලා D - මුහුදු මල	02
		ii.		නිවැරදි පිළිතුරට	01
		iii.		මුහුදු බෙල්ලා, මුහුදුමල	01
		iv.		අනාකුල හැඩයක් ගැනීම	01
		v.		ශක්තිමත් බාහිර ආවරණයක් තිබීම - වැනි නිවැරදි පිළිතුරක්	01
		vi.		නිවැරදි පිළිතුරකට	02
	(ආ)	i.		B ව්‍යුහය	01
		ii.		B හි ඇති අනාකුල හැඩය නිසා ජලයේ ගමන් කිරීමේදී ජලයේ ඇතිවන බාධාව/ ප්‍රතිරෝධය පහසුවෙන් ඉවත්වන වැනි නිවැරදි පිළිතුරකට	01
					12
03)		i.		නිවැරදි පිළිතුරු සඳහා	02
		ii.		ද්‍රාවක ගුණය	01
		iii.		නිවැරදි පිළිතුරු වලට	03
		iv.		සූර්ය තාපයෙන් මුහුදු ජලය වාෂ්ප කිරීමෙන් මීරාවල ඇති ජලය කොටසක් වාෂ්ප කිරීම.	02
		v.		A - උෂ්ණත්වමානයේ පාඨාංකය වෙනස් නොවේ.	
				B - උෂ්ණත්වමානයේ පාඨාංකය පහළ බසී.	02
		vi.		නිවැරදි පිළිතුරුවලට	02
					12
04)		i.		විලියම් ගිල්බර්ට්	01

		ii.		ධන ආරෝපණ, සෘණ ආරෝපණ	02
		iii.		ධන ආරෝපණ	01
		iv.		සෘණ ආරෝපණ	02
		v.		ධාරිත්‍රකය	01
		vi.		ෆැරඩ් (F)	01
		vii.		විකර්ශණය වේ.	02
		viii.		ඡායා පිටපත් යන්ත්‍රය, ගුවන් විදුලි යන්ත්‍රය වැනි නිවැරදි පිළිතුරු වලට	02
					12
05)	(අ)	i.		වදමල් යුෂ, කටරොළුමල් යුෂ වැනි ගැලපෙන දර්ශක දෙකකට	02
		ii.		දෙහි, විනාකිරි වැනි ද්‍රව්‍ය 2 කට	02
	(ආ)	i.		x	01
		ii.		y	01
		iii.		x	01
	(ඇ)	i.		ජලීය හයිඩ්‍රොක්ලෝරික් ද්‍රාවණය	01
		ii.		සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය	01
		iii.		ශල්‍ය ස්ප්‍රීතු ද්‍රාවණය	01
		iv.		ආප්ප සෝඩා } මිල්ක් ඔෆ් මැග්නීසියා පෙති }	02
					12
06)		i.		සූචකය (කටුව), උත්ක්‍රමණය වැනි නිවැරදි පිළිතුරකට	01
		ii.		සූචකය ප්‍රතිවිරුද්ධ දිශාවට උත්ක්‍රමණය වේ.	01
		iii.		ප්‍රත්‍යාවර්ත විද්‍යුත් ධාරාවක්	02
		iv.		නැත	01
		v.		LED අග්‍ර හා කෝෂ වල අග්‍ර නිවැරදිව සම්බන්ධ වී නොමැති වීම.	02
		vi.		සරල ධාරාවක්	02
		vii.		නිවැරදි පිළිතුරකට (උදාහරණ - සූර්ය කෝෂ)	02
		viii.		උත්ක්‍රමණය වන ප්‍රමාණය වැඩිවේ.	01
					12

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තුතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

3in1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ